# ප්‍රසන්න දික්ර්

Sinhali


المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بسلطانة

تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد

THE COOPERATIVE OFFICE FOR CALL & FOREIGNERS GUIDANCE AT SULTANAH

# كتاب الأذكار

أعده وترجمه إلى اللغة السنهالية:

## شعبة توعية الجاليات في الزلفي

الطبعة الأولى : ٢/١٤٢٥ هـ.

ح شعبة توعية الجاليات بالزلفي ، ١٤٢٥هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

شعبة توعية الجاليات بالزلفي
كتاب الأذكار – الزلفي ، ١٤٢٥ هـ
٨٤ ص؛ ٨ × ١٢ سم
ردمك : ٣- ٥٥- ٨٦٤- ٩٩٦٠
(النص باللغة السنهالية )
١-الأدعية والأوراد أ. العنوان
ديوي ٢١٢,٩٣ ١٤٢٥/٧٢٣

رقم الإيداع: ١٤٢٥/٧٢٣

ردمك: ٣-٥٥- ٨٦٤-٩٩٦٠

الصف والإخراج: شعبة توعية الجاليات في الزلفي

# ප්‍රසන්න දික්ර්
# كتاب الأذكار

## පෙරවදන

අල්ලාහ් මෙසේ පවසන්නේය.

අහෝ, විශ්වාස වන්තයිනි, අල්ලාහ්ව අධිකව දික්රු (සිහි) කරන්න. තවද, උදෑසන හා සවස් වරුවේ මහුව ප්‍රශංසා කරන්න.
(33: 41 – 42)

නබි (සල්) තුමා මෙසේ පවසන්නේය.

අල්ලාහ්ට ප්‍රශංසා කරන්නා හා ප්‍රශංසා නොකරන්නා පණ ඇති හා පණ නැති අයට සමානයව. (බුහාරි)

'දැනගන්න. ඔබලාගේ ක්‍රියාවන් අතර ශ්‍රේෂ්ඨමත්වූ, ඔබලාගේ ස්වාමියා හමුවෙහි ඉතා පවිත්‍ර වූ, ඔබලාගේ තරාතිරම උසස් කරන, රත්රන් හා රිදී අල්ලාහ්ගේ මාර්ග

යෙහි වියදම් කිරීමට වඩා උතුම් හා ශුද්ධවූ යුද්ධයෙහි ඔබලා සිය සතුරන් ඝාතන කළේ නම්, හෝ සතුරන් විසින් ඔබලා ඝාතනයට ලක්වූයේ නම් ලැබෙන කුලියට වඩා උතුම්වූ කාර්යයක් ඔබලාට හඳුන්වා දෙන්නද ?' යනු වෙන් නබි (සල්) තුමා විමසූ කළ එතුමාගේ අනුගාමිකයින් 'ඔව හඳුන්වා දෙන්න' යනු වෙන් කීහ. එකළ නබිතුමා 'අල්ලාහ්ව දික්ර් (සිහි) කරන්න' යැයි ප්‍රකාශ කළේය.

(තිර්මිදී)

දික්ර් යනු, අල්ලාහ්ව සිහි කිරීම, ඔහුව ප්‍රශංසා කිරීම, ඔහුට යාඥා කිරීම හා ඔහු ගෙන් ප්‍රාර්ථනා කිරීම යන අර්ථවලින් හැඳින් වේ. ඉස්ලාම් ධහමෙහි මෙයද වන්දනාමාන යක් ලෙස සළකනු ලබන්නේය. මන්ද යත්, නබි මුහම්මදු (සල්) තුමා 'ප්‍රාර්ථනා කිරීම වන්දනාමානයකි' යැයි පවසන්නේය.

(අබූදාවූද් හා තිර්මිදී)

එබැවින්, මෙය අල්ලාහ් හා ඔහුගේ දූත යාවූ නබිතුමා පෙන්වූ මාර්ගය අනුව පැවැතිය යුතුයි. අප රටවල සමහරුන් කිසියම් තේරුමක් නැති 'හා, හූ, හී' යනුවෙන්ද, හූ හූ යාමන්හූ යනුවෙන්ද, හක්තු හක් යනුවෙන්ද, අහ් අහ් අහ් යනුවෙන්ද කුමක්දෝ උසුරා දික්ර් ලෙස යාඥා කරන්නෝය. මේවා අල්ලාහ් හෝ නබිතුමා අපට අණ නොකළ දේය. නමුත් මෙම පොත් පිංචයෙහි අල්ලාහ් හා නබිතුමා පැවැසූ දික්ර් කීපයක් අන්තර් ගත කර ඇත්තෙමු.

එසේම 4444 යනුවෙන් අධික සංඛ්‍යාවක් නියමකොට ඒවා උසුරීමට නොහැකිව කුලියට මිනිසුන් අල්ලා උසුරීමද, ඒවා ඇඟිලිව ලින් ගණන් කිරීමට නොහැකිව කඩල, ගම්මිරිස්, තස්බීහ් මාලය හා ගණන් කිරීමේ යන්ත්‍ර යනාදීන් භාවිතා කොට උසුරීමද අද සමාජයෙහි දැකීමට හැකිවේ. කුඩා ප්‍රාර්ථනාවන් පවා උසුරීමට වෙහෙස නොදරා පිටස්තර

අයෙක් ගෙන්වා ඔහුට ප්‍රාර්ථනා කරන ලෙස පවසා ඔහු කරන ප්‍රාර්ථනාවන්ගේ අර්ථය නොදන්නා මිනිසා එයට (මෙම ප්‍රාර්ථනා පිළිගනු මැනව යනුවෙන්) ආමීන් පවසන් නේය. මේවා සියල්ල අල්ලාහ්ගේද නබිතුමා ගේද සුමගට පටහැනි නූතන බිද්අත් ක්‍රියා වන්ය. මන්දයත්, නබි මුහම්මදු (සල්) තුමා සිය ඇඟිලිවලින් පමණක් ගණන් කළේය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

(ඕ : නබි,) ඔබ සිත් සතතින් බැගෑපත් කමින් හා බියකමින් (සාවදානයෙන්) වචන යෙහි අධික ශබ්ද නොනගමින් අළුයම හා සවස් වරුවෙ ඔබ ස්වාමියාව සිහි කරන්න. ඔහුව අමතක කළ වුවන් සේ නොසිටින්න. (7:205)

මෙමමගින් ශබ්ද නොනගා නිශ්ශබ්දව දික්ර් (භාවනා) කරන මෙන් අල්ලාහ් අණ කරන්නේය.

මෙම පොත් පිංචයෙහි අල්කුර්ආන් හා නබිතුමාගේ මාර්ගයෙන් ලැබී ඇති සාධක සහිත ප්‍රාර්ථනාවන් හා භාවනාවන් පමණක් අන්තර්ගතකර ඇත. ප්‍රාර්ථනා කිරීමට අදාල නියමයන් හා ඒවා පිළිගනු ලැබීමට අවශ්‍ය කොන්දේසි කුර්ආන් හා නබිවදන්හි සඳහන් වේ. ඒවා කෙටියෙන් මෙහි සඳහන්වේ.

1-ප්‍රාර්ථනා කරන්නා ආගමෙන් තහනම්කර ඇති ආහාර පාන හා ඇඳුම් පැළඳුම්වලින් වැළකී සිටිය යුතුයි. ඒවා ආගමට පටහැනි මාර්ගවලින් උපයාගත් දේ නොවිය යුතුයි. මක්නිසාද, අල්ලාහ් මෙසේ පවසන්නේය.

නියතව, අල්ලාහ් පිළිගන්නේ බියබැති කමින් සිටින්නන්ගෙන් පමණි. (5:27)

2-අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ දේ නොලැබී මෙන් ක්ෂනික තීරණයකට එළඹා ප්‍රාර්ථනා කිරීමෙන් වැළකී සිටිය නොයුතුයි. පාප ක්‍රියාවන්හි යෙදීම හා ඥාතිත්වය විසංධි කිරීම කෙරෙහි ප්‍රාර්ථනා නොකළ යුතුයි.

3-ප්‍රාර්ථනා කරන දේ ලැබේ යැයි නිශ්චිත භාවයෙන් ප්‍රාර්ථනා කළ යුතුයි.

4-මුස්ලිම් වරයෙක් තම සහෝදර මුස්ලිම් වරයා වෙනුවෙන කරන ප්‍රාර්ථනාවන් පිළි ගනු ලැබේ.

5-අපරාධයට ලක්වූ තැනැත්තාගේ ප්‍රාර්ථනා හා අල්ලාහ් අතර කිසිදු තිර (බාධක)යක් නොපවතින බැවින්, එම ප්‍රාර්ථනා පිළිගනු ලැබේ.

6-සජ්දාවෙහි අධිකව ප්‍රාර්ථනා කරන්න. මන් දයත්, නබිතුමා 'මිනිසා එම තත්වයෙහි සිටිනවිට ඔහුගේ ස්වාමියා කෙරෙහි ඉතා සමීපව සිටින්නේය' යැයි පවසන්නේය.

(මුස්ලිම් හා නසාඉ)

7-අදාන් හා ඉකාමත් අතරෙහි කරන ප්‍රාර්ථ නාවන් පිළිගනු ලබන්නේය.

8-සෑම සලාතයේ අවසානයේද රාත්‍රියෙහි අව සන් කොටසේද කරන ප්‍රාර්ථනාවන් පිළි ගනු ලබන්නේය.

9-ප්‍රාර්ථනා කරන කළ ප්‍රථමයෙන් අල්ලාහ්ට ප්‍රශංසා කර, පසුව නබි මුහම්මදු (සල්) තුමාට සලවාත් කිව යුතුයි. පසුව තමාගේ අවශ්‍යථාවන් ගැන ප්‍රාර්ථනා කළ යුතුයි. පසුව තම දෙමාපියන් දරුවන් බිරිඳ හෝ සැමියා, ඥාතීන් හා වෙනත් මුස්ලිම්වරුන් සියළුම දෙනා වෙනුවෙන් ප්‍රාර්ථනා කළ යුතුයි.

10-සලාතය, උපවාසය, ඉඃතිකාෆ් (අල්ලාහ් වෙනුවෙන් දේවස්ථානයේ රැඳී සිටීම) හා පිං කිරීම වැනි සෑම කුසල් ක්‍රියාවන් කළ පසු ප්‍රාර්ථනා කළ හැක. ඉබ්‍රාහීම් (අලෙ) තුමාණන් කඃබා දේවස්ථානය ඉදිකළ පසු ප්‍රාර්ථනා කළේය. (2:127-128)

11-අල්ලාහ් හා නබිනායක තුමා පහදා දී ඇති ප්‍රාර්ථනාවන් හා යාඥාවන් කිසියම් වෙනස් කිරීමකින් තොරව එසේම උසුරිය යුතුයි.

12-පස්වෙල සලාත ඉටු කළ පසු, මළවුවන් භූමිදානය කළ පසු හා මෙවන් අවස්ථාවල කෙනෙක් ප්‍රාර්ථනා කිරීම හා එයට සවන් දෙන්නන් ආමීන් කීම වැනි අප රටවල පවතින චාරිත්‍රවලට කිසිම ආගමික සාධක නොමැත.

13-පිරිසක් එකට රැඳී සිටන් අල්ලාහ්ව සිහි කළ හැක. නබිතුමා මෙසේ පවසන්නේය. කණ්ඩායමක් අල්ලාහ්ව සිහිකිරීමෙහි යෙදී සිටියේ නම්, මලක්වරුන් ඔවුන් පිරිවරා සිටින්නෝය. අල්ලාහ්ගේ කරුණාව ඔවුන්ව වසා ගනී. ඔවුන් මත සැනසුම පහළ වේ. අල්ලාහ් තමාගේ හමුවෙහි සිටින (මලක් වරුන්) කණ්ඩායමෙහි ඔවුන් ගැන සිහි කරයි.

(මුස්ලිම් හා තිර්මිදි)

14-අල්ලාහ් සිහි කිරීමෙහි ඉතා ශ්‍රේෂ්ඨත්ව යෙන් පවතින්නේ අල්ලාහ්ගේ වැකි අඩංගු අල්කුර්ආන්ය.

# අළුයම හා සවස්වරුවට අදාල දික්ර්

1-කුල් හුවල්ලාහු අහද්, කුල් අඌදු බිරබ්බිල් ෆලක් හා කුල් අඌදු බිරබ්බින්නාස් යන පරිච්ඡේදයන් තුන්වරක් පාරායනා කිරීම.

2-ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලාෂරීක ලහු ලහුල්මුල්කු වලහුල්හම්දු වහුව අලා කුල්ලි ෂෙඉන් කදීර්. (වරක් හෝ 10 වරක් හෝ 100 වරක් උසුරීම)

لاَ إِلَهَ إِلاَّ اللهُ وَحْدَهُ لاَ شَرِيْكَ لَهُ ، لَهُ الْمُلْكُ وَلَهُ الْحَمْدُ

وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِيْرٌ

වන්දනාමාන බලයට සුදුස්සා ඔහු හැර අන් කවරෙක් හෝ නැත. ඔහු එක්කෙනෙකි. ඔහුට සමානව කිසිවක් හෝ නැත. පාලන බලය ඔහු සතුය. ප්‍රශංසා සියල්ල ඔහුටම හිමි වේ. ඔහු සෑම දේ කෙරෙහිම සූපිරි බලවතාය.

3-සුබ්හානල්ලාහි වබිහම්දිහි (100 වරක්)

سُبْحَانَ اللهِ وَبِحَمْدِه

අල්ලාහ්ට ප්‍රශංසාකර උත්කෘෂ්ට කරමි.

4-බිස්මිල්ලාහිල්ලදී ලා යලුර්රු මඅස්මිහි ෂයි උන් ෆිල් අර්ලි වලා ෆිස්සමාඉ වහුවස් සමී උල් අලීම (තුන් වරක්)

بِاسْمِ اللهِ الَّذِيْ لاَ يَضُرُّ مَعَ اسْمِهِ شَيْءٌ فِي الْأَرْضِ وَلاَ فِي السَّمَاءِ وَهُوَ السَّمِيعُ الْعَلِيمُ

කවරෙකුගේ නාමය සමග අහසෙහි හා පොළොවෙහි කිසියම් උවදුරක් හෝ සිදු නොවන්නේද එවන් අල්ලාහ්ගේ නාමයෙන් ප්‍රශංසා කරමි. ඔහු සෑම දේ කෙරෙහි සවන් දෙන්නා හා ඥාන වන්තයා ලෙස සිටින්නේය.

5-අඌදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ෂර්රි මා ක්හලක් (තුන් වරක්)

أَعُوذُ بِكَلِمَاتِ اللهِ التَّامَّاتِ مِنْ شَرِّ مَا خَلَقَ

අල්ලාහ්ගේ පරිපූර්ණ වචන මගින් ඔහු නිර්මාණය කළ දේහි උවදුරුවන් කෙරෙහි මා අල්ලාහ්ගෙන් ආරක්‍ෂා පතමි.

6-රළී(ත්)තු බිල්ලාහි රබ්බන් වබිල් ඉස්ලාමි දීනන් වබි මුහම්මදින් සල්ලල්ලාහු අලයිහි වසල්ලම නබියියන් වරසූලන් (තුන්වරක්)

رَضِيْتُ بِاللهِ رَبًّا وَبِالإِسْلاَمِ دِيْنًا وَبِمُحَمَّدٍ ﷺ نَبِيًّا رَسُولاً

මවා පෝෂණයකර ආරක්‍ෂා කරන ස්වාමියා වශයෙන් අල්ලාහ්වද, ආගම වශයෙන් ඉස්ලාමයද අල්ලාහ්ගේ දූතයා වශයෙන් නබි මුහම්මදු (සල්) තුමාවද පිළිගතිමි.

7-හස්බියල්ලාහු ලාඉලාහ ඉල්ලා හුව අලයිහි තවක්කල්තු වහුව රබ්බුල් අර්ෂිල් අළීම් (හත් වරක්)

حَسْبِيَ اللهُ لاَ إِلهَ إِلاَّ هُوَ عَلَيْهِ تَوَكَّلْتُ وَهُوَ رَبُّ الْعَرْشِ الْعَظِيْمِ

අල්ලාහ්ම මාහට ප්‍රමාණවත්වේ. ඔහු හැර වෙනත් කිසියම් ස්වාමියෙක් නැත. ඔහු

කෙරෙහිම මා විශ්වාසය තබා ඇත්තෙමි. ඔහු අර්ෂ (සිංහාසන)යෙහි ස්වාමියාය.

8-අස්බහ්නා අලා ෆිත්රතිල් ඉස්ලාමි, වඅලා කලිමතිල් ඉඛ්ලාස්, වඅලා දීනි නබියියිනා මුහම්මදින් වඅලා මිල්ලති අබීනා ඉබ්රාහීම හනීෆම් මුස්ලිමන් වමා කාන මිනල් මුෂ්රිකීන්.

أَصْبَحْنَا عَلَى فِطْرَةِ الْإِسْلَامِ ، وَعَلَى كَلِمَةِ الْإِخْلَاصِ ، وَعَلَى دِيْنِ نَبِيِّنَا مُحَمَّدٍ وَعَلَى مِلَّةِ أَبِيْنَا إِبْرَاهِيْمَ حَنِيْفًا مُسْلِمًا وَمَا كَانَ مِنَ الْمُشْرِكِيْنَ.

ඉස්ලාම්හි ස්වභාව ස්ථාවරයෙන්ද, ඒක දේවත්ව කලිමාවෙන්ද, අප මුහම්මදු (සල්) තුමාගේ ආගමෙන්ද, අපගේ පියානන්වූ ඉබ්රාහීම් (අලෛ) තුමාගේ මාර්ගයෙන්ද අපි උදෑසන වරුවට පැමිණීමු. ඉබ්රාහීම් අල්ලාහ්ට කීකරුවූ හා සත්‍ය ආගමට පක්ෂ වූ අයෙක් ලෙස සිටියේය. (අල්ලාහ්ට) සමාන කරන්නෙක් ලෙස නොසිටියේය.

සටහන :

මෙය උදෑසන වරුවට අදාල භාවනාවකි. සවස්වරුවෙ භාවනාකරන කළ අස්බහ්නා යන වචනය වෙනුවට අම්සයිනා යනුවෙන් වෙනස්කොට උසුරිය යුතුයි. අම්සයිනා යනු 'සවස් වරුවට පැමිණිමු' යැයි හැඳින්වෙ.

9-අස්බහ්නා වඅස්බහල් මුල්කු ලිල්ලාහි වල් හම්දු ලිල්ලාහ්, ලාඉලාහ ඉල්ලල්ලාහු වහ් දහූ ලා ෂරීක ලහූ, ලහුල් මුල්කු ව ලහුල් හම්දු, වහුව අලා කුල්ලි ෂෛඉන් කදීර්. රබ්බි අස්අලුක ක්හයිර මා ෆී හාදල් යව්මි වකයිර මා බඑදහූ, වඅඌදු බික මින් ෂර්රි මාෆී හාදල් යව්මි වෂර්රි මා බඑදහූ, රබ්බි අඌදු බික මිනල් කසලි වසූඉල් කිබ්රි, රබ්බි අඌදු බික මින් අදාබින් ෆින්නාරි, වඅදාබින් ෆිල් කබ්රි.

أَصْبَحْنَا وَأَصْبَحَ الْمُلْكُ لِلّه، وَالْحَمْدُ لِلّه، لاَ إِلَهَ إِلاّ اللهُ

وَحْدَهُ لاَ شَرِيْكَ لَهُ، لَهُ الْمُلْكُ وَلَهُ الْحَمْدُ وَهُوَ عَلَى كُلِّ

شَيْءٍ قَدِيْر، رَبِّ أَسْأَلُكَ خَيْرَ مَافِي هَذَا الْيَوْمِ وَخَيْرَ مَـا بَعْدَهُ وَأَعُوذُ بِكَ مِنْ شَرِّ مَا فِي هَذَا الْيَوْمِ وَشَرِّ مَا بَعْدَهُ، رَبِّ أَعُوْذُ بِكَ مِنَ الْكَسَلِ وَسُوْءِ الْكِبْرِ، رَبِّ أَعُوْذُ بِكَ مِنْ عَذَابٍ فِي النَّارِ وَعَذَابٍ فِي الْقَبْرِ

අපි උදෑසන වරුවට පැමිණියෙමු. පාලන බලය අල්ලාහ්ටම හිමිවිය. ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටය. වන්දනාමාන බලයට සුදුස්සා ඔහු හැර අන් කවරෙක් හෝ නැත. ඔහු එක්කෙනෙකි. ඔහුට සමානව කිසිවක් හෝ නැත. පාලන බලය ඔහු සතුය. සෑම ප්‍රශංසාවද ඔහුට හිමිය. ඔහු සෑම කෙරෙහි සුපිරි බලවතාය. ස්වාමිනී, අද දහවල්හි සිදුවන යහපතද, එයට පසුව සිදුවන යහ පතද මා ඔබෙන් අයදෙමි. අද දහවල්හි සිදුවන අයහපතෙන්ද, එයට පසුව සිදුවන අයයහපතෙන්ද මා ඔබෙන් ආරක්වරණය පතන්නෙමි. ස්වාමිනී, කම්මැලිකමින් හා

අහංකාර කමෙහි උවදුරුවලින් මා ඔබෙන් රැකවරණය පතන්නෙමි. ස්වාමිනී, නරකාදියෙහි හා මිනීවළෙහි සිදුවන වේදනාවලින් ඔබෙන් රැකවරණය පතන්නෙමි.

සටහන :

මෙය උදෑසන වරුවට අදාල භාවනාවකි. සවස්වරුවේ භාවනා කරන කළ අස්බහ්නා අස්බහල් මුල්ක් යන වචන වෙනුවට අම්සයිනා අම්සල් මුල්ක් යනුවෙන්ද යවම් යන වචනය වෙනුවට ලෛල් යනුවෙන්ද වෙනස් කොට උසුරිය යුතුයි.

10-නබි මුහම්මදු (සල්) තුමා තම අනුගාමිකයින්ට උදෑසන වරුවේ 'අල්ලාහුම්ම බික අස්බහ්නා වබික අම්සයිනා වබික නහ්යා වබික නමූතු ව ඉලෛකන් නුෂූර්' යනුවෙන්ද, සවස්වරුවේ 'අල්ලාහුම්ම බික අම්සයිනා වබික අස්බහ්නා වබික නහ්යා ව බික නමූතු වඉලෛකල් මසීර්' යනුවෙන් ද උසුරන මෙන් අණ කළේය. (තිර්මිදී)

اللّهُمَّ بِكَ أَصْبَحْنَا وَبِكَ أَمْسَيْنَا وَبِكَ نَحْيَا وَبِكَ نَمُوتُ وَإِلَيْكَ النُّشُورُ، اَللّهُمَّ بِكَ أَمْسَيْنَا وَبِكَ أَصْبَحْنَا وَبِكَ نَحْيَا وَبِكَ نَمُوتُ وَإِلَيْكَ الْمَصِيرُ

(උදෑසන වරුවේ) යා අල්ලාහ්, ඔබේ පිහිටෙන්ම අපි උදෑසන වරුවට පැමිණියෙමු. ඔබේ පිහිටෙන්ම අපි සවස් වරුවට පැමිණියෙමු. ඔබේ පිහිටෙන්ම ජීවත් වන්නෙමු. ඔබේ පිහිටෙන්ම මරණයට පත්වන්නෙමු. නැවත නැගිටවනු ලබන්නේද ඔබ වෙතය. (සවස් වරුවේ) යා අල්ලාහ්, ඔබේ පිහිටෙන්ම අපි සවස් වරුවට පැමිණියෙමු. ඔබේ පිහිටෙන්ම අපි උදෑසන වරුවට පැමිණියෙමු. ඔබේ පිහිටෙන්ම ජීවත්වන්නෙමු. ඔබේ පිහිටෙන්ම මරණයට පත්වන්නෙමු. නැවත ඒමද ඔබ වෙතය.

11-අල්ලාහුම්ම අස්බහ්නා, උෂ්හිදුක, වඋෂ්හිදු හමලත අර්ෂික, වමලාඉකතික, වජමීඅ (ක්)හල්කික, බිඅන්නක අන්තල්ලාහු ලා

ඉලාහ ඉල්ලා අන්ත වඃදක ලාෂරීක ලක, වඅන්න මුහම්මදන් අබ්දුක වරසූලුක. (වරක් හෝ වරකට වැඩියෙන් සිව වරක් උසුරිය හැක. සවස්වරුවෙ අස්බහ්තු වෙනු වට අම්සයිතු යනුවෙන් උසුරිය යුතුයි.)

اَللّٰهُمَّ أَصْبَحْتُ، أُشْهِدُكَ، وَأُشْـــهِدُ حَمَلَـــةَ عَرْشِـــكَ، وَمَلَائِكَتَكَ، وَجَمِيْعَ خَلْقِكَ، بِأَنَّكَ أَنْتَ اللهُ لَاإِلَـــهَ إِلاَّ أَنْتَ وَحْدَكَ لَاشَرِيْكَ لَكَ وَأَنَّ مُحَمَّدًا عَبْدُكَ وَرَسُوْلُكَ

යා අල්ලාහ් මා උදෑසන වරුවට පැමිණීමි. ඔබද, ඔබේ අර්ෂය උසුලා සිටින මලක් වරුන්ද, (වෙනත්) මලක් වරුන්ද, ඔබේ සෑම නිර්මාණයන්ද සාක්ෂි ලෙස ඉදිරිපත් කර කියන්නෙමි. නියතව අල්ලාහ් ඔබමය. වන්දනාමාන බලයට සුදුස්සා ඔබ හැර අන් කවරෙක් හෝ නැත. ඔබ එක්කෙනෙකි. ඔබට සමානව කිසිවක් හෝ නැත. නබි මුහම්මදු (සල්) තුමා ඔබගේ වහලාද දූත යාද වේ.

12-අල්ලාහුම්ම මා අස්බහ බී මින් නිඃමතින් අව බිඅහදිම්මින් ක්හල්කික ෆමින්ක වහ් දක ලා ෂරීක ලක, ෆලකල් හම්දු වලකෂ් ෂුක්‍ර්

(සවස්වරුවෙ අස්බහ වෙනුවට අම්සා යැයි කිව යුතුයි)

اَللّٰهُمَّ مَا أَصْبَحَ بِي مِنْ نِّعْمَةٍ أَوْ بِأَحَدٍ مِّنْ خَلْقِكَ فَمِنْكَ وَحْدَكَ لاَ شَرِيْكَ لَكَ ، فَلَكَ الْحَمْدُ وَلَكَ الشُّكْرُ

ස්වාමිනී, මාහට හෝ ඔබ නිර්මාණයෙන් කෙනෙකුට හෝ මෙම උදෑසන වරුවෙ (හෝ සවස් වරුවෙ) දායාදයක් ලැබෙනම්, එය ඒකීකයා හා කිසිඳු සමාන කරුවෙක් නොමැති ඔබෙන් ලැබූ එකකි. සියළුම ප්‍රශංසා හා කෘතඥතාවය ඔබටම හිමිවෙ.

13-යා හයියු යා කයියූමු බික අස්තගීසු, ෆ අස්ලිහ්ලී ෂඃනී, වලා තකිල්නී ඉලා නෆ්සී තරෆත අයිනී.

يَاحَيُّ يَا قَيُّومُ بِكَ أَسْتَغِيْثُ، فَأَصْلِحْ لِيْ شَأْنِيْ، وَلَا تَكِلْنِي إِلى نَفْسِيْ طَرْفَةَ عَيْنٍ

නිත්‍යව ජීවත් වන්නාණෙනි, ස්ථිරව සිටින්නාණෙනි, ඔබගෙන්ම මම රැකවරණය පතන්නෙමි. මාගේ කාර්යයන් සියල්ල මා හට ශීලාචාරය කර දෙනු මැනව. ඇහිපිල්ලම් කරන මොහොතක් පවා මාව (ඔබේ වගකීමෙන් ඉවත් කොට) මාගේ වගකීමෙන් අත් නොහරිනු මැනව.

14-අල්ලාහුම්ම ආෆිනී ෆී බදනී, අල්ලාහුම්ම ආෆිනී ෆීසම්ඊ, අල්ලාහුම්ම ආෆිනී ෆීබසරී, ලාඉලාහ ඉල්ලා අන්ත. (තුන් වරක්)

اَللّٰهُمَّ عَافِنِيْ فِيْ بَدَنِي ، اَللّٰهُمَّ عَافِنِيْ فِيْ سَمْعِيْ ، اَللّٰهُمَّ عَافِنِيْ فِيْ بَصَرِيْ ، لاَ إِلٰهَ إِلاَّ أَنْتَ

ස්වාමිනී, මාගේ ශරීරයෙහිද, මාගේ ශ්‍රවණය කිරීමෙහිද, මාගේ බැල්මෙහිද නිරෝගීභාවය ලබා දෙනු මැනව.

15-අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් කුෆ්රි වල්ෆක්ර්, වඅඌදු බික මින් අදාබිල් කබ්ර්, ලාඉලාහ ඉල්ලා අන්ත. (තුන්වරක්)

اَللّٰهُمَّ إِنِّي أَعُوْذُ بِكَ مِنْ الْكُفْرِ وَالْفَقْرِ، وَأَعُوْذُ بِكَ مِنْ عَذَابِ الْقَبْرِ ، لاَ إِلٰهَ إِلاَّ أَنْتَ

ස්වාමිනී, කුෆ්ර් (ප්‍රතික්ෂේප) කිරීමෙන්ද, දිළිඳු කමෙන්ද, මිනීවළෙහි වේදනාවෙන්ද මබෙන් ආරක්ෂාවරණය පතමි. වන්දනාමාන බලයට සුදුස්සා මබ හැර අන් කවරෙක් හෝ නැත.

16-අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් ආෆියත ෆිද්දුන්යා වල් ආකිරා, අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් අෆ්ව වල් ආෆියත ෆී දීනී වදුන් යාය වඅහ්ලී වමාලී, අල්ලාහුම්මස්තුර් අව රාතී, වආමින් රව්ආතී, අල්ලාහුම්මහ්ෆල්නී මින් බයිනි යදයිය, වමින් (ක්)හල්ෆී, වඅන් යමීනී, වඅන් ෂිමාලී, වමින් ෆවකී, වඅඌදු බිඅල්මතික අන් උග්තාල මින් තහ්තී.

اَللّٰهُمَّ إِنِّي أَسْأَلُكَ الْعَافِيَةَ فِيْ الدُّنْيَا وَالْآخِرَةِ، اَللّٰهُمَّ إِنِّي أَسْأَلُكَ الْعَفْوَ وَالْعَافِيَةَ فِي دِيْنِيْ وَدُنْيَايَ وَأَهْلِيْ وَمَالِيْ، اَللّٰهُمَّ اسْتُرْ عَوْرَاتِيْ، وَآمِنْ رَوْعَاتِيْ، اَللّٰهُمَّ احْفَظْنِيْ مِنْ بَيْنِ يَدَيَّ وَمِنْ خَلْفِيْ وَعَنْ يَمِيْنِيْ وَعَنْ شِمَالِيْ وَمِنْ فَوْقِيْ وَأَعُوْذُ بِعَظْمَتِكَ أَنْ أُغْتَالَ مِنْ تَحْتِيْ

ස්වාමිනී, මෙලෝ හා පරලෝ යහපත මා ඔබෙන් අයදිමි. ස්වාමිනී, මාගේ දහම, මාගේ මෙලෝ ජීවිතය, මාගේ පවුල හා මාගේ සම්පත් සැමෙහි යහපත හා සමාව අයදිමි. ස්වාමිනී, මාගේ අඩුපාඩු වසංකරනු මැනව. මාගේ බියකම තුරන්කොට මාහට සැනසුම ලබාදෙනු මැනව. ස්වාමිනී, මගේ ඉදිරියෙන්ද මගේ පිටුපසෙන්ද මගේ දකුණු දෙසෙන්ද මගේ වම් දෙසෙන්ද මගේ ඉහළ දෙසෙන්ද මට ආරක්ෂාව ලබාදෙනු මැනව. අනපේක්ෂිතව පොළොවේ කිඳා බැසීමෙන් මහාට ර‍ක්ෂාවරණය ලබා දෙනු මැනව.

17–අල්ලාහුම්ම ෆාතිරස්සමාවාත්ති වල් අර්ළි, ආලිමල් ගයිබි වෂ්ෂහාදා, රබ්බ කුල්ලි ෂයිඉන් වමලීකහු, අෂ්හදු අල්ලා ඉලාහ ඉල්ලා අන්ත, අඌදු බික මින් ෂර්රි නෆ්සී, වෂර්රිෂ් ෂයිතානි වෂිර්කිහි, වඅන් අක්ත රිෆ අලා නෆ්සී සූඅන්, අව අජුර්රුහු ඉලා මුස්ලිම්.

اَللّهُمَّ فَاطِرَ السَّموات وَالْأَرْضِ، عَالِمَ الْغَيْبِ وَالشَّهَادَة، رَبَّ كُلِّ شَيْءٍ وَمَلِيْكَهُ، أَشْهَدُ أَنْ لاَ إِلهَ إلاَّ أَنْتَ، أَعُوْذُ بِكَ مِنْ شَرِّ نَفْسِي، وَشَرِّ الشَّيْطَانِ وَشِرْكِه، وَأَنْ أَقْتَرِفَ عَلَى نَفْسِي سُوْءًا، أَوْ أَجُرَّهُ إِلَى مُسْلِمٍ

අහස් හා පොළොව මැවූ ස්වාමිනී, ගුප්තවූ හා ප්‍රසිද්ධවූ සැම දේ දැන සිටින්නාණෙනි, සැම දේහි ස්වාමියා හා පාලකයාණෙනි, වන්දනාමානයට සුදුසු ස්වාමියා ඔබ හැර අන් කවරෙක් හෝ නොමැති බව මා සාක්ෂි දරමි. මාගේ සිත්සතනෙහි උවදුරුවෙන්ද,

සාතාන්ගේ උවදුරුවෙන්ද සමාන කරවන
ඔහුගේ උවදුරුවෙන්ද මා ඔබෙන් රැකවර
ණය පතමි. තවද මා හට හෝ අන් මුස්ලිම්
වරුන්ට හෝ මා හානි සිදුකිරීම කෙරෙහි
ඔබෙන් රැකවරණය පතමි.

18-අල්ලාහුම්ම ඉන්නී අස්අලුක ඉල්මන්
නාෆිඅන්, වරිස්කන් තයියිබන්, වඅමලන්
මුතකබ්බලන්.

اَللّٰهُمَّ إِنِّي أَسْأَلُكَ عِلْمًا نَافِعًا، وَرِزْقًا طَيِّبًا، وَعَمَلاً مُتَقَبَّلاً

ස්වාමිනී, ප්‍රයෝජනවත් ඥානයද, පවිත්‍ර
ආහාරද, පිළිගනු ලබන ක්‍රියාවන්ද තිය
තව ඔබෙන් මා අයදිමි.

19-අල්ලාහුම්ම අන්ත රබ්බී, ලා ඉලාහ ඉල්ලා
අන්ත ඛලක්තනී, වඅන අබ්දුක, වඅන
අලා අහ්දික, වවඃදික මස්තතඃතු, අඌදු බික
මින් ෂර්රි මා සනඃතු, අබූඋ ලක බිනිඃම
තික අලෙයිය, වඅබූඋ ලක බිදන්බී ෆග්ෆිර්
ලී, ෆඉන්නහු ලා යග්ෆිරුද් දුනූබ ඉල්ලා
අන්ත.

اَللّهُمَّ أَنْتَ رَبِّيْ، لاَ إِلهَ إِلاَّ أَنْتَ خَلَقْتَنِيْ، وَأَنَا عَبْـــدُكَ، وَأَنَا عَلَى عَهْدِكَ، وَوَعْدِكَ مَااسْتَطَعْتُ، أَعُوذُ بِكَ مِـــنْ شَرِّ مَا صَنَعْتُ، أَبُوءُ لَكَ بِنِعْمَتِكَ عَلَيَّ، وَأَبُوءُ لَكَ بِذَنْبِيْ فَاغْفِرْ لِيْ، فَإِنَّهُ لاَ يَغْفِرُالذُّنُوبَ إِلاَّ أَنْتَ

ස්වාමිනී, මාගේ පාලකයා ඔබමය. එන්ද නාමානය කිරීමට ඔබ හැර අන් කවරෙක් හෝ නැත. මාව නිර්මානය කළේ ඔබමය. මම ඔබේ වහළාය. මම මාගේ හැකියාව අනුව ඔබේ පොරොන්දුව හා ගිවිසුම අනුව ක්‍රියා කරමි. මා කළ ක්‍රියාවන්හි උවදුරු වලින් ඔබෙන් රැකවරණය පතමි.

ඔබ මට පිරිනමා ඇති භාග්‍යයන් සියල්ල පිළිගනිමි. මා කළ පාපයන්ද පිළිගනිමි. එහෙයින්, මාගේ පාපයන් කමා කරනු මැනව. පාපයන් කමා කරන්නා ඔබ හැර අන් කවරෙක් හෝ නොමැත.

20-අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත අලා ඉබ් රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමී දුම් මජීද්, වබාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ් රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමී දුම් මජීද්,

اَللّٰهُمَّ صَلِّ عَلَى مُحَمَّدٍ وَ عَلَى آلِ مُحَمَّدٍ كَمَا صَـــلَّيْتَ عَلَى إِبْرَاهِيْمَ وَ عَلَى آلِ إِبْرَاهِيْمَ إِنَّكَ حَمِيـــدٌ مَجِيـــدٌ، وَبَارِكْ عَلَى مُحَمَّدٍ وَ عَلَى آلِ مُحَمَّدٍ كَمَا بَارَكْتَ عَلَى إِبْرَاهِيْمَ وَعَلَى آلِ إِبْرَاهِيْمَ إِنَّكَ حَمِيدٌ مَجِيدٌ

ස්වාමිනී, නබි ඉබ්රාහීම් (අලෛ) තුමාට සහ එතුමාගේ පවුලේ අයට ඔබේ කරුණාව පහළ කළාක් මෙන් නබි මුහම්මදු (සල්) තුමාට හා එතුමාගේ පවුලේ අය වෙතද ඔබේ කරුණාව පහළ කරනු මැනව. එසේම නබි ඉබ්රාහීම් (අලෛ)

තුමාට සහ එතුමාගේ පවුලේ අයට ඔබේ ආශීර්වාදය පහළ කළාක් මෙන් මුහම්මදු නබි (සල්) තුමාට හා එතුමාගේ පවුලේ අය වෙතද ඔබේ ආශීර්වාදය පහළ කරනු මැනව. නියතව, ඔබ ප්‍රශංසා හා කීර්තියට හිමිකම් ලත් අයෙක් ලෙස සිටින්නේය.

## නින්දෙන් අවදිවූ කළ :

21 - අල්හම්දු ලිල්ලාහිල්ලදී ආෆානී ෆී බදනී, වරද්ද අලයිය රූහී, වඅදින ලී බිදික්රිහි.

اَلْحَمْدُ لِلَّهِ الَّذِي عَافَانِيْ فِيْ بَدَنِيْ وَرَدَّ عَلَيَّ رُوحِيْ وَأَ ذِنَ لِيْ بِذِكْرِهِ

ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටම හිමිවේ. ඔහු මාගේ ශරීරයට ආරෝග්‍යය ලබාදී, මාගේ ප්‍රාණය මාහට නැවත ලබාදී, ඔහුවම සිහි කිරීම සඳහා මාහට අවසරය ලබා දුන්නේය. (තිර්මිදී)

22-අල්ලාහුම්ම අන්ත රබ්බී, ලාඉලාහ ඉල්ලා අන්ත ක්හලක්තනී, වඅන අබ්දුක, වඅන අලා අහ්දික, වවඃදික මස්තතඃතු, අඌදු බික මින්ෂර්රි මා සනඃතු, අබූඋ ලක බිති:මතික අලෙයිය, වඅබූඋ ලක බිසන්බී ෆග්ෆිර්ලී, ෆඉන්නහු ලායග්ෆිරුද් දුනූබ ඉල්ලා අන්ත.

اَللّهُمَّ أَنْتَ رَبِّيْ، لاَ إِلهَ إِلاَّ أَنْتَ خَلَقْتَنِيْ، وَأَنَا عَبْـــدُكَ، وَأَنَا عَلَى عَهْدِكَ، وَوَعْدِكَ مَااسْتَطَعْتُ، أَعُوذُ بِكَ مِـــنْ شَرِّ مَا صَنَعْتُ، أَبُوءُ لَكَ بِنِعْمَتِكَ عَلَيَّ، وَأَبُــوءُ لَـــكَ بِذَنْبِيْ فَاغْفِرْ لِيْ، فَإِنَّهُ لاَ يَغْفِرُ الذُّنُوبَ إِلاَّ أَنْتَ

ස්වාමිනී, මාගේ පාලකයා ඔබමය. වන්දනාමානය කිරීමට ඔබ හැර අන් කවරෙක් හෝ නැත. මාව නිර්මානය කළේ ඔබමය. මා ඔබේ වහළාය. මා මාගේ හැකියාව අනුව ඔබේ පොරොන්දුව හා ගිවිසුම අනුව ක්‍රියා කරමි. මා කළ ක්‍රියාවන්හි උවදුරු

වලින් ඔබෙන් රැකවරණය පතමි. ඔබ මාහට පිරිනමා ඇති භාග්‍යයන් සියල්ල පිළිගනිමි. මා කළ පාපයන් පිළිගනිමි. එහෙයින්, මාගේ පාපයන් කමා කරනු මැනව. පාපයන් කමා කරන්නා ඔබ හැර අන් කවරෙක් හෝ නොමැත.

මුහම්මදු (සල්) තුමා 'මෙය (පව් සමාව අයදීමේ) වැදගත් ප්‍රාර්ථනාවක් වන සෙයි යදුල් ඉස්තිඃෆාර්වේ. කවරෙක් ස්ථිර විශ් වාසයෙන් මෙය උදෑසන වරුවේ උසුරා, සවස් වරුව පැමිණීමට පෙර නැසී ගියේද, ඔහු ස්වර්ග වැසියකි. එසේම රාත්‍රියෙහි උසුරා (පසු දින) උදෑසන පැමිණීමට පෙර නැසී ගියේද, ඔහු ස්වර්ග වැසියකි' යනුවෙන් පවසන්නේය. මෙයින් කුමක් හෝ එකක් උසුරීමට හැක.

23-කුල් හුවල්ලාහු අහද්, කුල් අඌදු බිරබ් බිල් ෆලක් හා කුල් අඌදු බිරබ්බින්නාස් යන පරිච්ඡේදයන් තුන්වරක් සවස්වරුවේ

හෝ උදෑසන වරුවේ ඔබ පාරායනා කළේ නම්, සෑම අන්දමින්ම එය ඔබට ප්‍රාමාණි වන්වේ යැයි නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් ඉබ්නු කුබෛබ් (රලි) තුමා වාර්තා කරන්නේය. (අබූදාවූද්)

24-සුබ්හානල්ලාහි වබිහම්දිහි, අදද ක්හල් කිහි, වරිළා නෆ්සිහි, වසිනත අර්ෂිහි, වම් දාද කලිමාතිහි. (දිනපතා උදෑසන වරුවේ තුන් වරක්)

سُبْحَانَ اللهِ وَبِحَمْدِهِ عَدَدَ خَلْقِهِ وَرِضَا نَفْسِهِ وَزِنَةَ عَرْشِهِ وَمِدَادَ كَلِمَاتِهِ

අල්ලාහ්ව ඔහුගේ නිර්මානයන්ගේ ප්‍රමාණ යට, ඔහුගේ හදවත තෘප්තිවන ප්‍රමාණයට, ඔහුගේ අර්ෂ් හෙවත් සිංහාසනයෙහි බර ප්‍රමාණයට හා ඔහුගේ වචන ලියන තීන්ත ප්‍රමාණයට පවිත්‍ර කොට ප්‍රශංසා කරමි. (මුස්ලිම්)

# කුසල් ක්‍රියාවක් කරන කළ :

25–'ඔබලාගෙන් කවරෙක් හෝ කුසල් ක්‍රියා වක් කිරීමට අදහස් කළේ නම්, රකඅත් දෙකක කාලීන සලාතයක් ඉටුකළ පසු අල්ලාහ්ගෙන් මෙසේ ප්‍රාර්ථනා කරන්න' යනුවෙන් නබි (සල්) තුමා පවසන්නේය.

අල්ලාහුම්ම ඉන්නී අස්තගීරුක බිඉල්මික, ව අස්තක්දිරුක බිකුද්රතික, ව අස්අලුක මින් පලුලිකල් අලීම්, ෆඉන්නක තක්දිරු වලා අක්දිරු, වතඃලමු වලා අඃලමු, වඅන්ත අල්ලාමුල් ගුයූබ්. අල්ලාහුම්ම ඉන් කුන්ත තඃලමු අන්න හාදල් අමර ක්හයිරුන් ලී ෆී දීනී වමආෂී වආකිබති අම්රී, වආජිලිහි ව ආජිලිහි, ෆක්දුර්හු ලී ව යස්සිර්හු ලී, තුම්ම බාරික්ලී ෆීහි, වඉන් කුන්ත තඃලමු අන්න හාදල් අමර ෂර්රුන් ලී ෆී දීනී ව මආෂී වආකිබති අම්රී වආජිලිහි වආජිලිහි ෆස්රිෆ්හු අන්නී, වස්රිෆ්නී අන්හු, වක්දුර්

ලී අල් ක්හයිර හයිසු කාන, සුම්ම අර්ළිනී බිහි.

اَللّٰهُمَّ إِنِّي أَسْتَخِيرُكَ بِعِلْمِكَ، وَأَسْتَقْدِرُكَ بِقُدْرَتِكَ، وَأَسْأَلُكَ مِنْ فَضْلِكَ الْعَظِيمِ، فَإِنَّكَ تَقْدِرُ وَلاَ أَقْدِرُ، وَتَعْلَمُ وَلاَ أَعْلَمُ ، وَأَنْتَ عَلاَّمُ الْغُيُوبِ. اَللّٰهُمَّ إِنْ كُنْتَ تَعْلَمُ أَنَّ هَذَا الْأَمْرَ خَيْرٌ لِي فِي دِينِي وَمَعَاشِي وَعَاقِبَةِ أَمْرِي ، وَعَاجِلِهِ وَآجِلِهِ ، فَاقْدُرْهُ لِيْ وَيَسِّرْهُ لِي، ثُمَّ بَارِكْ لِي فِيهِ ، وَ إِنْ كُنْتَ تَعْلَمُ أَنَّ هَذَا الْأَمْرَ شَرٌّ لِيْ فِي دِينِي وَمَعَاشِي وَعَاقِبَةِ أَمْرِي ، وَعَاجِلِهِ وَآجِلِهِ ، فَاصْرِفْهُ عَنِّي ، وَاصْرِفْنِي عَنْهُ ، وَاقْدُرْ لِي الْخَيْرَ حَيْثُ كَانَ ، ثُمَّ أَرْضِنِي بِهِ.

ස්වාමිනී, මබේ ඥානය මගින් මබෙන් යහපත අයදිමි. මබේ ශක්තිය මගින් මබෙන් ශක්තිය අයදිමි. මබෙන් මා මබේ උතුම්වූ දායාදය අයදිමි. මක්නිසාදයත්, මබ ශක්ති

වත්තයාවන අතර, මාහට කිසිඳු ශක්තියක් හෝ නැත. ඔබ සැම දේ දැන සිටින්නා අතර, මා කිසිවක් නොදැන සිටින්නාය. ගුප්තව පවතින සැම දේ කෙරෙහි ඉතා ඥාන වත්තයා ඔබමය. ස්වාමිනී, මෙම කාර්ය මටද, මගේ ආගමටද, මගේ ජීවිතය ටද, මගේ කාර්යයෙහි අවසන් නිමාවටද, ක්ෂනිකව හා ප්‍රමාදව පවතින කාර්යයන් ටද යහපතක් බව ඔබ දකින්නේනම්, එය මාහට එසේම පත්කොට එය මාහට සරල කරනු මැනව. පසුව, එහි මාහට ඔබේ අභිවෘධිය පහළ කරනු මැනව.

මෙම කාර්ය මටද, මගේ ආගමටද, මගේ ජීවිතයටද, මගේ කාර්යයෙහි අවසන් නිමා වටද, ක්ෂනිකව හා ප්‍රමාදව පවතින කාර්ය යන්ටද අයහපතක් බව ඔබ දකින්නේනම්, එය මාගෙන් ඉවත් කරනු මැනව. එයින් මාවද ඉවත් කරනු මැනව. එය කුමන තරම් උසස් කාර්යයක් වුවත්, එය මාහට

යහපතක් ලෙස පරිවර්තනය කොට පසුව එය මට තෘප්තිවත සේ පත් කරනු මැන.
(බුහාරි)

## සලාතය අවසන් කළායින් පසු :

26–නබි මුහම්මදු (සල්) තුමා සලාතය අවසන් කළායින් පසු 'අස්තඃෆිරුල්ලාහ් තුන් වරක්ද, පසුව අල්ලාහුම්ම අන්තස්සලාම්, වමින්කස්සලාම්, තබාරක්ත යාදල් ජලාලි වල් ඉක්රාම්, ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලාෂරීකලහු, ලහුල් මුල්කු වලහුල් හම්දු, ව හුව අලා කුල්ලි ෂයිඉන් කදීර්. අල්ලාහුම්ම ලාමානිඅ ලිමා අඃතයිත, වලා මුඃතිය ලිමා මනඃත, වලා යන්ෆඋ දල්ජද්දි මින්කල් ජද්දු' යනුවෙන් වරක්ද උසුරන්නේය.
(බුහාරි හා මුස්ලිම්)

اَللّٰهُمَّ أَنْتَ السَّلَامُ ، وَمِنْكَ السَّلَامُ ، تَبَارَكْتَ يَا ذَا الْجَلَالِ وَالْإِكْرَامِ، لاَ إِلٰهَ إِلاَّ اللهُ وَحْدَهُ لاَ شَرِيكَ لَهُ، لَهُ

الْمُلْكُ وَلَهُ الْحَمْدُ وَهُوَ عَلي كُلِّ شَيْءٍ قَديرٌ، اَللّٰهُــمَّ لاَ مَا نِعَ لِمَا أَعْطَيْتَ ، وَلاَ مُعْطِيَ لِمَا مَنَعْتَ ، وَلا يَنْفَعُ ذا الْجَدِّ مِنْكَ الْجَدُّ.

ස්වාමිනී, ශාන්ති වන්තයා ඔබමය. ශාන්තිය පහළ වන්නේද ඔබෙන් සිටය. කීර්තියට සහ ගරුත්වයට හිමි ඔබ ශ්‍රේෂ්ඨ මන්විය. වන්දනාමානයට සුදුසු ස්වාමියා අල්ලාහ් හැර වෙනත් කවරෙක් නොමැත. ඔහු එක්කෙනෙකි. ඔහුට සමානව කිසිවක් හෝ නැත. සියළු ප්‍රශංසා හා පාලන බලය ඔහු සතුය. සැම දේ කෙරෙහි ඔහු බලවතාය. ස්වාමිනී, ඔබ ලබාදෙන දෙයට බාධා කරන්නා හා ඔබ ලබා නොදෙන දේ ලබා දෙන්නා කවරෙක් හෝ නොමැත. කවර ධනවතෙකුගේ ධනය හෝ ඔබේ දඬුවමින් ඔහුව ආරක්ෂා කළ නොහැක.

27-සෑම සලාතයක් අවසන් කළායින් පසු කුල් හුවල්ලාහු අහද්, කුල් අඌදු බිරබ්බිල් ෆලක් හා කුල් අඌදු බිරබ්බින්නාස් යන පරිච්ජේදයන් පාරායනා කරන මෙන් නබි මුහම්මදු (සල්) තුමා මාහට අණ කළ බව උක්බා ඉබ්නු ආමිර් (රලි) තුමා වාර්තා කරන්නේය. (අබූදාවූද්)

28-නබි මුහම්මදු (සල්) තුමා 'අහෝ මුආද්, මා ඔබව ප්‍රිය කරමි. එහෙයින්, ඔබ සෑම සලාතයකින් පසුම 'අල්ලාහුම්ම අඉන්නී අලා දික්රික වෂුක්රික වහුස්නි ඉබාදතික' යනුවෙන් උසුරන්න යනුවෙන් මාව අමතා ප්‍රකාශ බව මුආද් (රලි) තුමා වාර්තා කරන්නේය.

اَللّٰهُمَّ أَعِنِّي عَلٰى ذِكْرِكَ وَشُكْرِكَ وَحُسْنِ عِبَادَتِكَ

ස්වාමිනී, ඔබව සිහි කිරීමටත්, ඔබට තුති පුද කිරීමටත්, ඔබට නිසියාකාරව වන්දනා මාන කිරීමටත් මට උපකාර කරනු මැන.

## වැසිකිලියට පිවිසෙන කළ :

29-වැසිකිලියට පිවිසෙන කළ 'අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් (ක්)හුබුසි වල් (ක්)හබාඉසි' යනුවෙන් උසුරිය යුතුයි.

اَللّهُمَّ إِنِّي أَعُوذُ بِكَ مِنَ الْخُبُثِ وَالْخَبَائِث.

ස්වාමිනී, ස්ත්‍රී හා පිරිමි සාතාන්වරුන්ගේ උවදුරුවලින් මා ඔබෙන් ර්‍ෂකවරණය පතන්නෙමි. (බුහාරි හා මුස්ලිම්)

30-වැසිකිලියෙන් පිටවන කළ 'ගුෆ්රානක' යනුවෙන් උසුරිය යුතුයි.

غُفْرَانَكَ

(ස්වාමිනී,) මා ඔබෙන් පව සමාව අයදිමි. (අබූදාවූද්)

31-දෝවනය කිරීමට පෙර 'බිස්මිල්ලා' යනුවෙන් උසුරිය යුතුයි.

بِسْمِ الله

අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි.
(අහ්මද් හා අබූදාවූද්)

32-දෝවනය කළ පසු 'අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලාෂරීකලහු, වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු.

أَشْهَدُ أَنْ لاَإِلَهَ إِلاَّ اللهُ وَحْدَهُ لاَ شَرِيكَ لَهُ وَأَشْهَدُ أَنَّ مُحَمَّداً عَبْدُهُ وَرَسُولُهُ

වන්දනාමාන බලයට සුදුස්සා අල්ලාහ් හැර අන් කවරෙක් හෝ නොමැති බව මා සාක්ෂි දරමි. ඔහු එක්කෙනෙකි. ඔහුට සමානව කිසිවක් හෝ නැත. එසේම, නබි මුහම්මදු (සල්) තුමා ඔහුගේ වහලා හා දූතයා බවද මා සාක්ෂි දරමි. (මුස්ලිම්)

## නිවසින් පිටත්වන කළ :

33-බිස්මිල්ලාහි තවක්කල්තු අලල්ලාහි වලා හවල වලා කුව්වත ඉල්ලා බිල්ලාහි.

بِسْمِ اللهِ تَوَكَّلْتُ عَلَى اللهِ وَلاَ حَوْلَ وَلاَ قُوَّةَ إِلاَّ بِاللهِ

අල්ලාහ්ගේ නාමයෙන් පිටත් වන්නෙමි. මම අල්ලාහ් වෙතම විශ්වාසය තබා ඇත්තෙමි. කුසලක් කිරීමටද, අකුසලින් වැළකීමටද අල්ලාහ්ගේ පිහිටෙන් තොරව කිසියම් හැකියාවක් හෝ අපහට නොමැත.
(අබූදාවූද් හා තිර්මිදි)

## නිවැස්තුල පිවිසෙන කළ :

34-බිස්මිල්ලාහි වලජ්නා, වබිස්මිල්ලාහි ක්හරජ්නා, වඅලා රබ්බිනා තවක්කල්නා.

بِسْمِ اللهِ وَلَجْنَا، وَبِسْمِ اللهِ خَرَجْنَا، وَعَلَى رَبِّنَا تَوَكَّلْنَا

අල්ලාහ්ගේ නාමයෙන් (නිවැස් තුල) පිවිසෙමු. අල්ලාහ්ගේ නාමයෙන් (නිවසින්) පිටත්වෙමු. අප ස්වාමියා කෙරෙහිම මුළු විශ්වාසයම තබා ඇත්තෙමු. (අබූදාවූද්)

## දේවස්ථානය තුල පිවිසෙන කළ :

35-අඌදු බිල්ලාහිල් අළීම, වබි වජ්හිහිල් කරීම, වසුල්තානිහිල් කදීම, මිනශ් ෂයිතා

නිර්රජීම, බිස්මිල්ලාහි වස්සලාත්තු වස්ස ලාමු අලා රසූලිල්ලාහි, අල්ලාහුම්මෆ්තහ් ලී අබ්වාබ රහ්මතික.

أَعُوذُ بِاللهِ الْعَظِيمِ، وَبِوَجْهِهِ الْكَرِيمِ، وَسُلْطَانِهِ الْقَدِيمِ، مِنَ الشَّيْطَانِ الرَّجِيمِ ، بِسْمِ اللهِ وَالصَّلاةُ وَالسَّلامُ عَلَى رَسُولِ اللهِ، اَللَّهُمَّ افْتَحْ لِي أَبْوَابَ رَحْمَتِكَ

උතුම්වූ අල්ලාහ්ගේ පිහිටෙන්ද, ඔහුගේ ගෞරවනීය මුහුණෙහි පිහිටෙන්ද, නිත්‍යවූ ඔහුගේ සුපිරි බලයෙහි පිහිටෙන්ද පලවා හරින ලද ෂෛයිතාන්ගේ උවදුරුවලින් මා රැකවරණය පතමි. අල්ලාහ්ගේ නාමයෙන් මා (දේවස්ථානය තුල) සිවිසෙමි. අල්ලාහ් ගේ කරුණාව හා ආශීර්වාදය ඔහුගේ දූත යාවූ නබි මුහම්මදු (සල්) තුමාට පහළවනු මැනව. ස්වාමිනී, ඔබගේ කරුණාවෙහි දොරටු මාහට විවෘත කරනු මැනව.

(මුස්ලිම්)

## දේවස්ථානයෙන් පිටත්වන කළ :

36 – බිස්මිල්ලාහි, වස්සලාත්තු වස්සලාමු අලා රසූලිල්ලාහි, අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මින් ෆලුලික, අල්ලාහුම්මඃසිම්නී මිනෂ්ෂයි තානිර් රජීම්.

بِاسْمِ اللهِ ، وَالصَّلاةُ وَالسَّلامُ عَلى رَسُولِ اللهِ ، اَللّٰهُمَّ إِنِّي أَسأَلُكَ مِنْ فَضْلِكَ ، اَللّٰهُمَّ اعْصِمْنِي مِنَ الشَّيْطَانِ الرَّجِيمِ

අල්ලාහ්ගේ නාමයෙන් (දේවස්ථානය සිට) පිටත්වීමි. අල්ලාහ්ගේ කරුණාව හා ආශීර් වාදය ඔහුගේ දූතයාවූ නබි මුහම්මදු (සල්) තුමාහට පහළවනු මැනව. ස්වාමිනී, මා ඔබෙන් ඔබේ කරුණාව අයදිමි. ස්වාමිනී, පළවා හරිනලද ෂයිතාන්ගෙන් මාව රැක ගනු මැනව.

(අබූදාවූද්)

# අදාන් අඩගසන කළ :

37–අදානයට සවන් දෙන්නා එලෙසම කිව යුතුයි. නමුදු, හයිය අලස් සලාහ් හා හයිය අලල් ෆලාහ් යනුවෙන් කියවන කළ 'ලා හවල වලා කුවවත ඉල්ලා බිල්ලාහ්' යනු වෙන් කිව යුතුයි. අදාන් අවසන්වූ පසු නබි තුමාට සලවාත් කියවා පසුව මෙසේ ප්‍රාර්ථනා කළ යුතුයි.

اَللّٰهُمَّ رَبَّ هذه الدّعْوَة التَّامَّة ، وَالصّلاة القَائِمَـــة آت مُحَمَّدًا الْوَسيلَةَ وَالْفَضيلَةَ ، وَابْعَثْهُ مَقامًا مَحْمُودًا الَّذي وَعَدتَّهُ ، إِنَّكَ لاَ تُخْلِفُ الْميعادَ

මෙම පරිපූර්ණ කැඳවීමට හා ස්ථිර සලාත යට හිමි ස්වාමිනී, නබි මුහම්මදු (සල්) තුමාට වසීලා නම්වූ උසස් තරාතිරම හා ශ්‍රේෂ්ඨත්වය ලබා දෙනු මැනව. එසේම, එතුමාට ඔබ පොරොන්දුවූ පරිදි මහ්මූද් නම්වූ ස්ථානයෙහි එතුමාව නගිටවනු

මැනව. සැබැවින්ම, ඔබ පොරොන්දු කඩ නොකරන්නෙකි.

'කවරෙක් මෙසේ ප්‍රාර්ථනා කරන්නේද, ඔහුට පරලොව දිනයේ මාගේ තිර්දේශය ස්ථිරවිය' යනුවෙන් නබිතුමා පවසන්නේය. (බුහාරි)

## නින්දට සැරසෙන කළ :

38-'ඔබලා නින්දට ගියේනම්, ආයතුල් කුර්සී යන (අල්කුර්ආන්-2:255) වැකිය පාරයනා කරන්න. එසේ කළේනම්, ඔබව අඛණ්ඩව ආරක්‍ෂා කරන අල්ලාහ්ගේ ආරක්‍ෂකයෙක් ඔබ සමග සිටින අතර, පසු දින උදෑසන දක්වා ෂෛතාන් ඔබට ළං නොවී සිටී' නබි නායක මුහම්මදු (සල්) තුමා යනුවෙන් පව සන්නේය. (බුහාරි) එම ආයතුල් කුර්සි වැකිය මෙසේය.

අල්ලාහු ලා ඉලාහ ඉල්ලා හුවල් හයියුල් කයියූම්, ලා තඃකුදුහු සිනතුන් වලා නවම්,

ලහූ මා ෆිස්සමාවාති වමා ෆිල් අර්ලි, මන් දල්ලදී යෂ්ෆඋ ඉන්දහූ ඉල්ලා බි ඉද්නිහී, යඃලමු මා බෛන අයිදීහිම් වමා (ක්)හල් ෆහුම්, වලා යුහීතූන බිෂෙයිම් මින් ඉල් මිහි, ඉල්ලා බිමා ෂාඅ වසිඅ කුර්සියියුහුස් සමාවාත්ති වල් අර්ල්, වලා යඌදුහූ හිෆ්ලු හුමා වහුවල් අලියියුල් අළීම්.

اَللهُ لاَ إِلَهَ إِلاَّ هُوَ الْحَيُّ الْقَيُّومُ، لاَ تَأْخُذُهُ سِنَةٌ وَلاَ نَوْمٌ، لَهُ مَا فِي السَّمَاوَاتِ وَمَا فِي الْأَرْضِ، مَنْ ذَا الَّذِي يَشْفَعُ عِنْدَهُ إِلاَّ بِإِذْنِهِ، يَعْلَمُ مَا بَيْنَ أَيْدِيهِمْ وَمَا خَلْفَهُمْ وَلاَ يُحِيطُونَ بِشَيْءٍ مِنْ عِلْمِهِ، إِلاَّ بِمَا شَاءَ وَسِعَ كُرْسِيُّهُ السَّمَاوَاتِ وَالْأَرْضَ، وَلاَ يَؤُودُهُ حِفْظُهُمَا وَهُوَ الْعَلِيُّ الْعَظِيمُ

අල්ලාහ්, ඔහු හැර අන් ස්වාමියෙක් නැත. ඔහු සදාතනිකද සමස්ත විශ්වයේ පාලක යාදවෙ. ඔහු සැතපෙන්නේවත් නිද්‍රෝපගත

වන්නේවත් නැත. අහස් හා මහ පොළො වෙහි යමක් වේද, ඒ ඔහුගේය. ඔහුගේ අවසරය පරිදි විනා ඔහු සමග මැදිහත්විය හැක්කේ කාහටද ?. ජනතාව ඉදිරියේ ඇති දෙයත්, ඔවුන්ගෙන් සැඟවී ඇති දෙයත්, ඔහු දනී. ඔහු සිය කැමැත්තෙන්ම අනාවරණය කරනු ලබන දෙයක් විනා ඔහුගේ ඥාන සම්භාරයෙන් කිසිවක් හෝ ඔවුන්ට අවබෝධකර ගත නොහැක. ඔහු ගේ රාජ්‍යය අහස් පුරාත්, මහ පොළෝ තලය මතත් විහිදෙයි. මේ දෙක රැකවල් කිරීම ඔහුට වෙහෙස ගෙන දෙන්නක් නොවේ. උත්තරීතර හා උත්කෘෂ්ට වන්නේ ඔහු පමණකි. (අල්කුර්ආන්-2:255)

39-නබිනායක මුහම්මදු (සල්) තුමා සෑම රාත්‍රියකම නිදියහනයට යනවිට තම දෑත් අත්ල දෙක යාකොට එහි පිඹා, කුල් හුවල්ලාහු අහද්, කුල් අඌදු බිරබ්බිල් ෆලක් හා කුල් අඌදු බිරබ්බින්නාස් යන පරිච්ජේද

පාරායනා කරන්නේය. පසුව තම හැකියාව අනුව ශරීරයෙහි සෑම තැන්හි පිරිමදින්නේය. සිය හිසෙන් ආරම්භකොට මුහුණ ඇතුළුව තම ශරීරයෙහි ඉදිරි කොටසෙහි පිරිමදින්නේය. මෙසේ තුන් වරක් කරන්නේය. මේ බව ආයිෂා (රළි) තුමිය වාර්තා කරන්නීය. (බුහාරි හා මුස්ලිම්)

40-ඔබලාගෙන් කවරෙක් හෝ නින්දට යන්නේනම්, ඔහු තම ඇඳුමෙහි එක් කෙළවරකින් තම නිදියහනය තට්ටු කරන්වා. මන්දයත්, ඔහු (පෙර) එයින් පිටත්වූ පසු එය කරා කුමක් (හෝ පක්ෂියෙක්) පැමිණියේද යන්නෙහි ඔහු නොදන්නේය. පසුව 'බිස්මි කල්ලාහුම්ම, වලෑතු ජන්බී වබිස්මික අර්ෆඋහු, ඉන් අම්සක්ත නෆ්සී ෆර්හම්හා, වඉන් අර්සල්තහා ෆහ්ෆල්හා බිමා තහ්ෆලු බිහි ඉබාදකස් සාලිහීන්' යනුවෙන් පවසන්න' යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා පවසන්නේය. (බුහාරි)

بِاسْمِكَ اللّهُمَّ وَضَعْتُ جَنْبِيْ ، وَبِاسْـــمِكَ أَرْفَعُـــهُ ، إِنْ أَمْسَكْتَ نَفْسِيْ فَارْحَمْهَا ، وَإِنْ أَرْسَلْتَهَا فَاحْفَظْهَا بِمَـــا تَحْفَظُ بِهِ عِبَادَكَ الصَّالِحِيْنَ

ස්වාමිනී, ඔබ නාමයෙන් මාගේ ඇලය පහත තබමි. ඔබ නාමයෙන්ම මා නැගි ටිමි. (නින්දයෙහි) මාගේ ප්‍රාණය ඔබ අත් පත් කළේනම්, එයට ඔබ කරුණාව පහළ කරනු මැනව. එය ඔබ අත්හරියේ නම්, ඔබගේ යහපත්ශීලීන් ආරක්ෂා කරන සේ එයද ආරක්ෂා කරනු මැනව.

41- නබිනායක මුහම්මදු (සල්) තුමා 'කම් කරුවෙක් සිට ඔබට ආවතේව කිරීමට වඩා විශිෂ්ඨ දෙයක් මම ඔබලාට වටහා දෙන්නද? (යනුවෙන් විමසා, පසුව) ඔබලා නින්දට යනවිට සුබ්හාන්ලලාහ් 33 වරක් ද, අල්හම්දු ලිල්ලාහ් 33 වරක්ද, අල්ලාහු අක්බර් 34 වරක්ද උසුරන්න. එය ඔබලාට මෙහෙකරුවෙකුට වඩා උතුමය' යනුවෙන්

අලී (රලි) තුමා සහ ෆාතිමා (රලි) තුමිය අමතා ප්‍රකාශ කළේය. (බුහාරි)

42-නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

'ඔබ නින්ද යාම සඳහා ඔබේ නිදියහනයට යන කළ සලාතයට කරන සේ දෝවනය කරගන්න. පසුව පැත්තකට හාන්සිවී නිදා ගෙන මෙසේ උසුරන්න. එදින රාත්‍රී ඔබ නැසීගියේනම්, ඉස්ලාම්හි ස්වභාවයෙන්ම ඔබ නැසීගිය අයෙකු සේය. පසු දින උදෑසන ඔබ නිරෝගිමත්ව නැගිටවෙ. මෙය ඔබේ (එදින) කථාබහක අවසන් වචන ලෙසට පත්කර ගන්න. (පසුව කිසියම් කථාබහක නොයෙද නිදාගන්න) (බුහාරි)

අල්ලාහුම්ම අස්ලම්තු නෆ්සී ඉලෙයික, ව වජ්ජහ්තු වජ්හී ඉලෙයික, වෆව්වල්තු අම්රී ඉලෙක, වඅල්ජ:තු ලහ්රී ඉලෙක, රග් බතන් වරහ්බතන් ඉලෙක, ලා මල්ජඅ ව

ලාමන්ජඅ මින්ක ඉල්ලා ඉලයික, ආමන්තු බිකිතාබිකල්ලදී අන්සල්ත, වනබියියිකල් ලදී අර්සල්ත.

اَللَّهُمَّ أَسْلَمْتُ نَفْسِي إِلَيْكَ ، وَوَجَّهْتُ وَجْهِي إِلَيْكَ ، وَفَوَّضْتُ أَمْرِي إِلَيْكَ ، وَأَلْجَأْتُ ظَهْرِي إِلَيْكَ ، رَغْبَةً وَرَهْبَةً إِلَيْكَ ، لاَ مَلْجَأَ وَلاَ مَنْجَأَ مِنْكَ إِلاَّ إِلَيْكَ ، آمَنْتُ بِكِتَابِكَ الَّذِي أَنْزَلْتَ ، وَنَبِيِّكَ الَّذِي أَرْسَلْتَ

ස්වාමිනී, මා මාව ඔබට භාර කරමි. මගේ මුහුණ ඔබ දෙසට හරවා ගත්තෙමි. මගේ කාර්යයන් ඔබ වෙත භාරකර ඇත්තෙමි. ඔබ කෙරෙහි බියෙන් හා උනන්දුවෙන් මගේ පිටකොන්ද ඔබ කරා හාන්සි කරමි. ඔබ හැර මාහට ලැගුම් ගැනීමට හෝ බේරීමට හෝ ස්ථානයක් නොවන්නේය. මා ඔබ පහළ කළ ඔබේ ග්‍රන්ථයද, ඔබ එවූ ඔබේ දූතවරයාද විශ්වාස කරමි.

## සිහිනය :

43-නබි මුහම්මදු (සල්) තුමා 'සුභ සිහින අල්ලාහ්ගෙන් සිටද, අසුභ සිහින සාතාන් ගෙන් සිටද සිදුවන්නේය. ඔබලාගෙන් කව රෙක් හෝ තමාට ප්‍රිය කරන සිහිනයක් දුටුවේනම්, ඒ බව තමාගේ ප්‍රියවන්තයින්ට පමණක් පැවැසිය යුතුයි. ඔබලාගෙන් කව රෙක් හෝ අප්‍රිය කරන සිහිනයක් දුටුවේ නම්, ඔහු තම වම් දෙස කරා තුන්වරක් කෙල ගසා එකී උවදුරුවලින් අල්ලාහ් ගෙන් රැකවරණය පැතිය යුතුයි.

පසුව ඔහු නිදාගෙන සිටි ස්ථාවරය වෙනස් කොට නිදාගත යුතුයි. ඒ බව ඔහු අන් කවරෙකුට හෝ නොපැවැසිය යුතුයි. එය ඔහුට කිසියම් විපාකයක් සිදු නොකරයි' යැයි පවසන්නේය.

## ආහාර ගැනීමට පෙර හා පසු :

44-"ඔබලාගෙන් කවරෙක් හෝ ආහාර අනුභව කිරීමට පෙර 'බිස්මිල්ලාහ්' යනුවෙන් උසුරනු. එසේ ආරම්භයේදී උසුරීමට අමතක වූයේනම්, සිහිවූ කළ 'බිස්මිල්ලාහි ෆී අව්වලිහි වආකිරිහි' (ආරම්භයට හා අවසානයට එකට අල්ලාහ්ගේ නාමය කියමි) යනුවෙන් උසුරනු' යනුවෙන් නබි මුහම්මදු (සල්) තුමා පවසන්නේය. (අබූදාවූද්)

45-ආහාර අනුභව කළ පසු 'අල්හම්දු ලිල්ලාහිල්ලදී අත්අමනී හාදා වරසක්නීහි මින් ගයිරි හව්ලින් මින්නී වලා කුව්වතින්' යනුවෙන් උසුරනු යැයි නබිනායක මුහම්මදු (සල්) තුමා පවසන්නේය. (අබූදාවූද්)

اَلْحَمْدُ للهِ الَّذِي أَطْعَمَنِي هذا، وَرَزَقَنِيه مِنْ غَيْرِ حَوْلٍ مِنِّي وَلاَ قُوَّة

ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටම හිමි වේ. මෙම ආහාරය මාහට ලබා දුන්නේ ඔහුමය. මගේ

කිසියම් වෙහෙසකින් හෝ ශක්තියකින් තොරව මෙය මාහට ඔහු ලබා දුන්නේය.

## උපවාසයෙන් මිදන කළ :

46-දහබල් ළමඋ, වබ්තල්ලතිල් උරුක්කු, ව සබතල් අජ්රු ඉන්ෂා අල්ලාහ්.

ذَهَبَ الظَّمَأُ، وَابْتَلَّتِ الْعُرُوْقُ، وَ ثَبَتَ الْأَجْرُ إِنْ شَاءَ اللهُ

පිපාසය සංසිඳේ, නරයන් තෙත් විය. අල් -ලාහ් මනාප වන්නේනම්, කුලිය ලැබේ.

## කිඹුහුමක් කළ පසු :

47-නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

ඔබලාගෙන් කෙනෙකුට කිඹුහුමක් පිටවී නම්, ඔහු 'අල්හම්දු ලිල්ලාහ් (ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටම හිමිවේ)' යනුවෙන්ද, (එයට සවන් දෙන) ඔහුගේ මිත්‍රයා හෝ සහෝදරයා යර්හමුකල්ලාහ් (අල්ලාහ් ඔබට

ආශිර්වාදය කරනු මැන) යනුවෙන්ද කිව යුතුයි. එසේ යර්හමුකල්ලාහ් යනුවෙන් කීවෙනම්, ඔහු (කිඹුහුම යැවූ තැනැත්තා) 'යහ්දීකුමුල්ලාහ් වයුස්ලිහ් බාලකුම් (අල් -ලාහ් ඔබහට යහමග පෙන්වාදී ඔබගේ තත්ත්වය ශීලාචාරය කරනු මැනව)' යනු වෙන් කිව යුතුයි. (බුහාරි)

## කුකුළා හා බූරුවාගේ හඬට සවන් දෙන කළ :

48-නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

ඔබලා කුකුළාගේ හැඬලීමට සවන් දුන් නේනම්, අල්ලාහ්ගෙන් ඔහුගේ භාග්‍යය (අල්ලාහුම්ම ඉන්නී අස්අලුක මින් පලුලික යනුවෙන්) අයදින්න. මන්ද යත් එය සුර දූතයෙකුව දුටුවේය. බූරුවාගේ නප්පුලු හඬට සවන් දුන්නේනම්, පලවා හරින ලද ෂෙයිතාන්ගේ උවදුරුවලින් අල්ලාහ්ගෙන්

(අඌදු බිල්ලාහි මිනෂ් ෂෛයිතානිර් රජීම් යනුවෙන්) රැකවරණය පතන්න. මන්දයත් එය ෂයිතානය දුටුවෙය. (බුහාරි)

## වැස්ස අපේක්ෂාකර කරන කළ :

49-අල්ලාහුම්ම අගිස්නා, අල්ලාහුම්ම අගිස් -නා, අල්ලාහුම්ම අගිස්නා. (තුන් වරක්)

اَللّٰهُمَّ أَغِثْنَا، اَللّٰهُمَّ أَغِثْنَا، اَللّٰهُمَّ أَغِثْنَا

ස්වාමිනී, අපහට වැස්ස වස්සවනු මැනව. ස්වාමිනී, අපහට වැස්ස වස්සවනු මැනව. ස්වාමිනී, අපහට වැස්ස වස්සවනු මැනව.

## වැස්ස වැහෙවන කළ :

50-අල්ලාහුම්ම සයියිබන් නාෆිඅන්.

اَللّٰهُمَّ صَيِّبًا نَافِعًا

ස්වාමිනී, (මෙම වැස්ස) ප්‍රයෝජනවත් කරනු මැනව. (බුහාරි)

## වැස්ස වැසීමෙන් පසු :

51-මුතිර්නා බිෆලුලිල්ලාහි වරහ්මතිහි.

مُطِرْنَا بِفَضْلِ اللهِ وَرَحْمَتِهِ

අල්ලාහ්ගේ කරුණාවෙන් හා ආශීර්වාද යෙන් අපහට වැස්ස වස්සවන ලදී.

(බුහාරි හා මුස්ලිම්)

## වැස්ස උගුවුයේනම් :

52-අල්ලාහුම්ම හවාලෙයිනා වලා අලෙයිනා, අල්ලාහුම්ම අලල් ආකාමි වල්ලිරාබි, වබු තූනිල් අව්දියති, වමනාබිතිෂ් ෂජරි.

اَللّٰهُمَّ حَوَالَيْنَا وَلاَ عَلَيْنَا، اَللّٰهُمَّ عَلَى الْآكَامِ وَالظِّرَابِ،

وَبُطُونِ الْأَوْدِيَةِ، وَمَنَابِتِ الشَّجَرِ

ස්වාමිනී, අප මත නොමැතුව අප අවට ප්‍රදේශවල වැස්ස වස්සවනු මැනව. කඳු, කඳු ගැට, ඇළ දොළ හා කෘෂිකර්මාන්ත ප්‍රදේශවල වස්සවනු මැනව. (බුහාරි)

## මනාල මනාලියන්ට සුභ පතන කළ :

53-බාරල්ලාහු ලක වබාරක අලෙයික වජමඅ බයිනකුමා ෆී ක්හයිරින්.

بَارَكَ اللهُ لَكَ، وَبَارَكَ عَلَيْكَ، وَ جَمَعَ بَيْنَكُمَا فِي خَيْرٍ

අල්ලාහ් ඔබට අභ්‍යන්තරව හා භාහිරව ආශීර්වාදය කරනු මැනව. කුසල් කෙරෙහි ඔබ දෙදෙනා එකතු කරනු මැනව.
(අබූදාවූද් හා තිර්මිදි)

## සංසර්ගයෙහි යෙදීමට පෙර :

54-බිස්මිල්ලාහි, අල්ලා හුම්ම ජන්නිබ්නශ් ෂයිතාන, වජන්නිබිෂ් ෂයිතාන මා රසක් තනා.

بِسْمِ اللهِ، اَللّٰهُمَّ جَنِّبْنَا الشَّيْطَانَ وَجَنِّبِ الشَّيْطَانَ مَا رَزَقْتَنَا

අල්ලාහ්ගේ නාමයෙන් (සංසර්ගය) ආරම්භ කරමි. ස්වාමිනී, අපට හා අපට ලබා දෙන

දරුවාට ෂයිතාන්ගේ උවදුරුවලින් ආරක්ෂාවර ණය ලබා දෙනු මැනව.

(බුහාරි හා මුස්ලිම්)

## සභාවක් නිමවන කළ :

55-සුබ්හානකල්ලාහුම්ම වබි හම්දික, අෂ්හදු අල්ලාඉලාහ ඉල්ලා අන්ත, අස්තඃෆිරුක ව අතූබු ඉලෙයික.

سُبْحَانَكَ اللّهُمَّ وَبِحَمْدِكَ، أَشْهَدُ أنْ لآإِلَهَ إِلاَّ أَنْتَ، اَسْتَغْفِرُكَ وَأَتُوبُ إِلَيْكَ

ස්වාමිනී, ඔබව ප්‍රශංසා කොට උත්කෘෂ්ට කරමි. වන්දනාමානය කිරීමට සුදුසු ස්වාමියා ඔබ හැර අන් කවරෙක් හෝ නැති බව මම සාක්ෂි දරමි. ඔබගෙන් මම පව් සමාව අයදිමි. ඔබගෙන්ම පාපොච්චාරණය කරමි. (තිර්මිදි හා අබූදාවූද්)

## වාහනයක නැගූ කළ :

56-බිස්මිල්ලාහි, අල්හම්දු ලිල්ලාහිල්ලදී සහ් ගරලනා හාදා, වමා කුන්නා ලහු මුක්රි නීන්, වඉන්නා ඉලා රබ්බිනා ලමුන්කලි බූන්.

بِسْمِ اللهِ، اَلْحَمْدُ لِلّٰهِ الَّذِي سَخَّرَ لَنَا هذَا، وَمَا كُنَّا لَهُ مُقْرِنِينَ، وَإِنَّا إِلَى رَبِّنَا لَمُنْقَلِبُونَ

අල්ලාහ්ගේ නාමයෙන් (මෙම) ගමන ආරම්භ කරමි. ප්‍රශංසා සියල්ල අල්ලාහ් ටම හිමිවේ. මෙම වාහනය අපිට පහසු කර ලබා දුන්නේ මහුමය. නියතව, අපි එයට ශක්ති වන්තයින් නොවන්නන්ය. නියතව, අපි අප ස්වාමියා වෙතම නැවත යායුතුව සිටින්නෙමු. (අබූදාවූද්)

# ගමනෙහි කරන ප්‍රාර්ථනාව :

57- නබිනායක මුහම්මදු (සල්) තුමා ගමනක යෙදීම සඳහා වාහනයෙහි හිඳගත් කළ මෙසේ ප්‍රාර්ථනා කරන්නේය.

අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, සුබ්හානල්ලදී සහ්ගර ලනා හාදා, වමා කුන්නා ලහූ මුක්රිනීන්, ව ඉන්නා ඉලා රබ්බිනා ලමුන්කලිබූන්, අල්ලාහුම්ම ඉන්නා නස්අලුක ෆී සෆරිනා හාදා අල් බිර්ර වත්තක්වා, වමිනල් අමලි මා තර්ළා,

අල්ලාහුම්ම හව්වින් අලෙයිනා සෆරනා හාදා වත්ව් අන්නා බුඃදා, අල්ලාහුම්ම අන් තස් සාහිබු ෆිස්සෆර්, වල් කලීෆතු ෆිල් අහ්ල්, අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් වඃසාඉස් සෆර්, වකආබ්බතිල් මන්ලර්, ව සූඉල් මුන්කලබ්, ෆිල් මාලි වල් අහ්ල්,

اَللهُ أكْبَرُ ، اَللهُ أكْبَرُ ، اَللهُ أكْبَرُ ، سُبْحَانَ الَّذي سَخَّرَ لَنَا هذَا وَماَ كُنَّا لَهُ مُقرِنِينَ ، وَإنَّا إلَى رَبِّنَا لَمُنْقَلِبُونَ ، اَللّهُمَّ إنَّا نَسْأَلُكَ فِي سَفَرِنَا هذَا البِرَّ وَالتَّقْوَي ، وَمِنَ الْعَمَلِ مَا تَرْضَى ، اَللّهُمَّ هَوِّنْ عَلَيْنَا سفَرَنَا هذَا واطْوِ عَنَّا بُعْدَهُ ، اَللّهُمَّ أنْتَ الصَّاحِبُ فِي السَّفَرِ ، وَالْخَلِيفَةُ فِي الأَهْلِ ، اَللّهُمَّ إنِّي أعُوذُ بِكَ مِنْ وَعْثَاءِ السَّفَرِ ، وَكَآبَةِ الْمَنْظَرِ ، وَسُوءِ الْمُنْقَلَبِ فِي الْمَالِ وَالأَهْلِ.

ගමන අවසන් කොට ගමට පැමිණ කළ මෙම ප්‍රාර්ථනාව සමග අමතරව මෙසේද ප්‍රාර්ථනා කළ යුතුයි.

ආයිබූන, තාඉබූන, ආබිදූන, ලිරබ්බිනා හාමිදූන්

آئبُونَ، تَائبُونَ، عَابِدُونَ، لِرَبِّنَا حَامِدُونَ

ආපසු පැමිණෙන්නෙමු. පාපොච්චාරණය කරන්නෙමු. අප ස්වාමියාට වන්දනාමානය

කරන්නන් හා ප්‍රශංසා කරන්නන් සේ සිටින්නෙමු. (මුස්ලිම්)

## ණය බර, ශෝකය හා කරදරවලින් මිදීම සඳහා :

58-අල්ලාහුම්මක්ෆිනී බිහලාලික අන් හරාමික වඅග්නිනී මින්ෆල්ලික, අම්මන් සිවාක.

اَللّٰهُمَّ اكْفِنِيْ بِحَلاَلِكَ عَنْ حَرَامِكَ وَأَغْنِنِيْ مِنْ فَضْلِكَ عَن مَّنْ سِوَاكَ

ස්වාමිනී, ඔබ තහනම් කළ දේ හැර අනුමත කළ දෙයින් (පමණක්) මාහට ප්‍රමාණවත් කරනු මැන. ඔබේ කරුණාවෙන් ඔබ හැර අන් සැම දේ කෙරෙහි මා අනවශ්‍ය වන්නෙක් ලෙස පත්කරනු මැන. (තිර්මිදි)

59-දිනක් නබිනායක මුහම්මදු (සල්) තුමා දේවස්ථානයට පිවිසීය. එහි දුටු අබූ උමාමා (රලි) යන අන්සාර් අනුගාමියා අමතා 'සලාතයක් නොවන අවස්ථාවේ ඔබ දේවස්ථා

තයේ හිඳගෙන සිටින්නේ ඇයි?' යනුවෙන් විමසීය. එයට මහු 'අල්ලාහ්ගේ දූතවරයා ණොති ණය බර, දුක හා දුෂ්කරථාවන් මාව වද කරන්නේය' යැයි කීය. එකල නබිතුමා 'මා ඔබට සමහර වචන කියා දෙන්නම්, ඒවා ඔබ උසුරන්නේනම්, අල් -ලාහ් ඔබේ දුක තුරන්කොට ඔබේ ණය බර පියවා දෙයි' යනුවෙන් පැවැසීය.

පසුව, එතුමා 'ඔබ උදෑසන වරුවේ හා සවස්වරුවේ 'අල්ලාහුම්ම ඉන්නී අඌදුබික මිනල් හම්මි වල්හසන්, වඅඌදු බික මිනල් අජ්සි වල්කසල්, වඅඌදු බික මිනල් ජුබ්නි වල් බුහ්ල්, වඅඌදු බික මින් ගලබතිද් දයිනි වකාහ්රිර් රිජාල්' යනුවෙන් උසුරන්න යැයි පැවැසීය. ඒ අනුව මා එය පාරායනා කළෙමි. අල්ලාහ් මාගේ දුක ඉවත් කොට මගේ ණය බර අවසන් කළේය. මෙය අබු උමාමා (රලි) තුමා වාර්තා කරන්නේය. (බුහාරි)

اَللّهُمَّ إِنِّي أَعُوذُ بِكَ مِنَ الْهَمِّ وَالْحَزَنِ ، وَأَعُوذُ بِكَ مِنَ الْعَجْزِ وَالْكَسَلِ ، وَأَعُوذُ بِكَ مِنَ الْجُبْنِ وَالْبُخْلِ، وَأَعُوذُ بِكَ مِنْ غَلَبَةِ الدَّيْنِ وَقَهْرِ الرِّجَالِ.

ස්වාමිනී, දුක, කරදර, නොහැකියාව, කම්මැලිකම, බියකම, ලෝභකම, ණය බර අභිබවා යාම හා මිනිසුන්ගෙන් මර්දනය කිරීම් යනාදියින් කෙරෙහි මා ඔබගෙන් රැකවරණය පතමි.

## ඇඳුම් අඳින කළ :

60-අල්හම්දු ලිල්ලාහිල්ලදී කසානී හාදස්සවබ වරසකනීහි මින් ගයිරි හවලිම් මින්නී වලා කුව්වතින්.

اَلْحَمْدُ للهِ الَّذِي كَسَانِيْ هذَا الثَّوْبَ ، وَرَزَقَنِيهِ مِنْ غَيْرِ حَوْلٍ مِنِّيْ وَلاَ قُوَّةٍ

සියළු ප්‍රශංසා අල්ලාහ්ටම හිමිවේ. මාගේ කිසියම් වෙහෙසකින් හෝ හැකියාවකින්

තොරව මෙම ඇඳුම මට ඇන්දුවේ ඔහුමය. (තිර්මිදි)

## නව ඇඳුමක් අඳින කළ :

61-අල්ලාහුම්ම ලකල් හම්දු අන්ත කසව්තනීහි, අස්අලුක මින් ක්හයිරිහි වහයිරි මා සුනිඅ ලහු, ව අඌදු බික මින් ෂර්රිහි ව ෂර්රි මා සුනිඅ ලහු.

اَللّٰهُمَّ لَكَ الْحَمْدُ ، أَنْتَ كَسَوْتَنِيه ، أَسْأَلُكَ مِنْ خَيْرِه وَخَيْرِ مَا صُنِعَ لَهُ ، وَأَعُوذُ بِكَ مِنْ شَرِّهِ وَشَرِّ مَا صُنِعَ لَهُ

ස්වාමිනී, සියළු ප්‍රශංසා ඔබටම හිමිවේ. මෙම ඇඳුම මාහට ඇන්දුවේ ඔබමය. මෙහි යහපතද, මෙය කුමක් සඳහා සාදා ඇත්ද එහි යහපතද ඔබෙන් අයදිමි. මෙහි අයහපතද, මෙය කුමක් සඳහා සාදා ඇත්ද එහි අයහපතද කෙරෙහි මා ඔබෙන් ආරක්ෂා පතමි.

(තිර්මිදි)

## සතුරන් හා පාලකයන් හමුවන කළ :

62-නබිනායක මුහම්මදු (සල්) තුමා සිය සතුරන් හා පාලකයන් හමුවන කළ 'අල්ලාහුම්ම ඉන්නා නජ්අලුක ෆී නුහූරිහිම්, වනඌදු බික මින් ෂුරූරිහිම්' යනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය.

اَللّٰهُمَّ إِنَّا نَجْعَلُكَ فِي نُحُورِهِمْ ، وَنَعُوذُ بِكَ مِنْ شُرُورِهِمْ

මාගේ ස්වාමිනී, ඔවුන් ඉදිරියේ ඔබව පත් කරන්නෙමි. ඔවුන්ගේ උවදුරුවන් කෙරෙහි ඔබෙන් රැකවරණය පතමි. (අබූදාවූද්)

## පොදු ප්‍රාර්ථනාවන් :

63-අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් හුදා, වත් තුකා වල්අෆාෆ් වල්ගිනා.

اَللّٰهُمَّ إِنِّي أَسْأَلُكَ الْهُدَى، وَالتُّقَى، وَالْعَفَافَ، والغِنَى

ස්වාමිනී, මා ඔබෙන් යහමග, බියකම, සදාචාරය හා ප්‍රමාණවත්කම අයදිමි.

(මුස්ලිම්)

64-පුද්ගලයෙක් නබිනායක මුහම්මදු (සල්) තුමාගේ හමුවට පැමිණ 'අල්ලාහ්ගේ දූත යාණෙනි, මා මාගේ ස්වාමියාගෙන් කුමක් ප්‍රාර්ථනා කළ යුතුද ?' යැයි විමසීය. එකළ එතුමා "අල්ලාහුම් මග්ෆිර්ලී, වර්හම්නී, වආෆිනී, වර්සුක්නී" යනුවෙන් ප්‍රාර්ථනා කරන්න. මෙය ඔබේ මෙලෝ ජීවිතයට හා පරලෝ ජීවිතයට ප්‍රමාණවත් වේ' යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

اَللّٰهُمَّ اغْفِرْلِي، وَارْحَمْنِي، وَعَافِنِي، وَارْزُقْنِي

ස්වාමිනී, මාහට සමාව ලබා දෙනු මැනව. මාහට ආශිර්වාද කරනු මැනව. මාහට නිරෝගීභාවය ලබා දෙනු මැනව. මාහට ආහාර සපයනු මැනව.

65-නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්ලා හුම්ම මුසර්රිෆල් කුලූබි සර්රිෆ් කුලූබනා අලා තාඅතික' යැයි ප්‍රාර්ථනා කරන්නේය. (මුස්ලිම්)

اَللّٰهُمَّ مُصَرِّفَ الْقُلُوبِ صَرِّفْ قُلُوبَنَا عَلَى طَاعَتِكَ

හදවත් පෙරළන ස්වාමිනී, අපගේ මදවත් ඔබට කීකරුවීමෙහි පෙරළනු මැනව.

66-අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් ජහ් දිල් බලාඉ, වදර්කිෂ් ෂකාඉ, වසූඉල් කළාඉ, වෂමාතතිල් අඃදාඉ.

اَللّٰهُمَّ إِنِّي أَعُوْذُ بِكَ مِنْ جَهْدِ الْبَلاءِ ، وَدرَكِ الشَّقَاءِ ، وَسُوْءِ الْقَضَاءِ ، وَشَمَاتَةِ الْأَعْدَاءِ

ස්වාමිනී, මහත් පීඩා, දුර්භාග්‍ය, නපුරු නිමාව හා (තමා ලක්වන පීඩාවන් ගැන) සතුරන් සතුටුවීම යනාදිය කෙරෙහි මා ඔබෙන් ආරක්ෂාවරණය පතමි.

(බුහාරි හා මුස්ලිම්)

67-නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ ප්‍රාර්ථනා කරන්නේය.

අල්ලාහුම්ම අස්ලිහ් ලී දීනී අල්ලදී හුව ඉස්මතු අම්රී, වඅස්ලිහ් ලී දුන්යාය අල් ලතී ෆීහා මආෂී, වඅස්ලිහ් ලී ආකිරතී අල්ලතී ෆීහා මආදී, වජ්අලිල් හයාත සියා දතන්ලී ෆී කුල්ලි ක්හයිර්, වජ්අලිල් මවත රාහතන් ලී මින් කුල්ලි ෂර්.

اَللّٰهُمَّ أَصْلِحْ لِيْ دِيْنِيَ الَّذِيْ هُوَ عِصْمَةُ أَمْرِي ، وَأَصْلِحْ لِيْ دُنْيَايَ الَّتِيْ فِيهَا مَعَاشِيْ ، وَأَصْلِحْ لِيْ آخِرَتِيَ الَّتِيْ فِيهَا مَعَادِيْ ، وَاجْعَلِ الْحَيَاةَ زِيَادَةً لِيْ فِيْ كُلِّ خَيْرٍ ، وَاجْعَلِ الْمَوْتَ رَاحَةً لِيْ مِنْ كُلِّ شَرٍّ.

ස්වාමිනී, මාහට මාගේ ආගම ශීලාචාර කරනු මැනව. මාගේ ක්‍රියාවන්ට රැකවර ණය එයමය. මාහට මාගේ මෙලොව ශීලා චාර කරනු මැනව. මාගේ ජීවිතවය පවතින්නේ එහිමය. මාහට මා නැවත යාම

පවතින මාගේ පරලොව (දිනය) ශීලාචාර කරනු මැනව. ජීවිතය මාහට සෑම කුසල් ක්‍රියාවෙන්ම වැඩියෙන් පවතින සේ පත් කරනු මැනව. මරණය මාහට සෑම අකුසල් ක්‍රියාවෙන්ම සැනසුමක් බවට පත්කරනු මැනව.

68-අල්ලාහුම් මග්ෆිර්ලී ක්හතීඅතී වජහ්ලී, වඉස්රාෆී ෆී අම්රී, වමා අන්ත අඃලමු බිහි මින්නී, අල්ලාහුම්ම ග්ෆිර්ලී ජිද්දි වහස්ලී, ව(ක්)හතර් වඅම්දි, වකුල්ලු දාලික ඉන්දි, අල්ලාහුම්මග්ෆිර්ලී මා කද්දම්තු වමා අග් හර්තු, වමා අස්රර්තු වමා අඃලන්තු, වමා අන්ත අඃලමු බිහි මින්නී, අන්තල් මුකද් දිමු, ව අන්තල් මුඅග්හිරු, ව අන්ත අලා කුල්ලි ෂෛඉන් කදීර්.

اَللّٰهُمَّ اغْفِرْلِي خَطِيْئَتِيْ وَجَهْلِيْ ، وَإِسْرَافِيْ فِيْ أَمْرِي ، وَمَا أَنْتَ أَعْلَمُ بِهِ مِنِّيْ ، اَللّٰهُمَّ اغْفِرْلِيْ جِدِّيْ وَهَزْلِــيْ ، وَخَطَئِيْ وَعَمْدِيْ ، وَكُلُّ ذٰلِكَ عِنْدِيْ ، اَللّٰهُمَّ اغْفِرْلِيْ مَا

قَدَّمْتُ وَمَا أَخَّرْتُ ، وَ مَاأَسْرَرْتُ وَمَا أَعْلَنْتُ ، وَمَا أَنْتَ أَعْلَمُ بِهِ مِنِّي ، أَنْتَ الْمُقَدِّمُ ، وَأَنْتَ الْمُؤَخِّرُ ، وَ أَنْتَ عَلَى كُلِّ شَيْءٍ قَدِيرٌ

ස්වාමිනී, මාගේ වැරදිකම, මාගේ නොදැනුවත්කම, මාගේ කාර්යයන්හි මා සීමා ඉක්මවා යාම හා කුමන පව මාහට වඩා ඔබ දැන සිටින්නේද, ඒවාද කමා කරනු මැනව. ස්වාමිනී, මා මිනැකමින්, විහිළුවෙන්, වැරදි සහගතව හා හිතුවත්කාර කමින් කළ පාපයන් කමා කරනු මැනව. මේවා සියල්ල සිදුව ඇත්තේ මාගෙනි. ස්වාමිනී, මා පෙර කළ, පසු කළ, රහසිගතව කළ, ප්‍රසිද්ධියෙන් කළ හා කුමන පව මාහට වඩා ඔබ දැන සිටින්නේද, ඒවාද කමා කරනු මැනව. ප්‍රථම වන්නයා හා අවසන් වන්නයා ඔබමය. එසේම, සෑම දෙයහි බල වතාද ඔබමය.

(බුහාරි)

69-නබිනායක මුහම්මදු (සල්) තුමා ‘අල්ලා හුම්ම ඉන්නී අඌදු බික මිනල් බරසි, වල් ජුනූනි, වල් ජුදාමි, වසයියිඉල් අස්කාම්’ යනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය.

اَللّٰهُمَّ إِنِّيْ أَعُوذُ بِكَ مِنَ الْبَرَصِ ، وَالْجُنُونِ، وَالْجُذَامِ ، وَسَيِّءِ الْأَسْقَامِ.

ස්වාමිනී, සුදු කුෂ්ඨ, පිස්සුකම කලු කුෂ්ඨ හා දුෂ්ඨ රෝගයන් කෙරෙහි මා ඔබෙන් ආරක්‍ෂාව පතමි. (අබූදාවූද්)

70-නබි (සල්) ‘අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මින් මුන්කරාතිල් අඛ්ලාකි, වල් අඃමාලි, වල් අහ්වාඉ’ යැයි ප්‍රාර්ථනා කරන්නේය.

اَللّٰهُمَّ إِنِّيْ أَعُوذُ بِكَ مِنْ مُنْكَرَاتِ الْأَخْلَاقِ ، وَالْأَعْمَالِ، وَالْأَهْوَاءِ

ස්වාමිනී, දුෂ්ඨ ගුණාංග, නපුරු ක්‍රියාවන් හා මනෝඅද ආශාවන් කෙරෙහි මා ඔබෙන් ආරක්‍ෂාව පතමි. (තිර්මිදි)

## රෝගයෙන් මිදීම සඳහා :

71-නබිනායක මුහම්මදු (සල්) තම පවුල් ඥාතීන් කවරෙකුව හෝ සුව දුක් විමසීමට ගියේනම්, ඔහුව සිය දකුණු අතින් පිරිමදා 'අල්ලාහුම්ම රබ්බන්නාස්, අස්හිබිල් බෑස්, වෂ්ෆි, අන්තෂ් ෂාෆී ලා ෂිෆාඅ ඉල්ලා ෂිෆාඋක, ෂිෆාඅන් ලායුගාදිරු සකමා යනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය.

اَللّٰهُمَّ رَبَّ النَّاسِ ، أَذْهِبِ الْبَأْسَ، وَاشْفِ ، أَنْتَ الشَّافِيْ

لاَ شِفَاءَ إِلاَّ شِفَاؤُكَ ، شِفَاءً لاَ يُغَادِرُ سَقَمًا.

ස්වාමිනී, මිනිසුන් මවා පාලනය කරන්නානෙනි, (අපෙන්) රෝගය ඉවත් කොට (සෑම ලෙඩක් සඳහාම) නිවාරණය ලබා දෙනු මැනව. නිවාරණය ලබා දෙන්නා ඔබ මය. ඔබේ නිවාරණය හැර අන් කිසිවක් හෝ නිවාරණයක් වීමට නොහැක.

(බුහාරි)

## රෝගියාට ප්‍රාර්ථනා කිරීම :

72-නබිනායක මුහම්මදු (සල්) තුමා සුවදුක් විමසීමට ගියේනම්, ඔහුගේ ලෙඩ පිළිබඳව විමසා 'ලා බඃස, තහූරුන් ඉන්ෂා අල්ලාහ්' යනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය. (බුහාරි)

لاَ بَأسَ طَهُورٌ إنْ شَاءَ اللهُ

කිසියම් ප්‍රශ්නයක් නොවන්නේය. ඉන්ෂා අල්ලාහ් නිවාරණය ලැබේ.

73-උස්මාන් බින් අබිල් ආස් (රලි) තුමා තම ශරීරයෙහි පවතින වේදනාව පිළිබඳව නබි නායක මුහම්මදු (සල්) තුමාහට කී කළ එතුමා 'ඔබේ ශරීරයේ වේදනාව පවතින ස්ථානයේ ඔබේ අත තබා 'බිස්මිල්ලාහ්' තුන්වරක්ද, පසුව 'අඌදු බි ඉස්සතිල්ලාහි, වකුද්රතිහි, මින් ෂර්රි මා අජිදු වඋහාදිරු' යනුවෙන්' හත් වරක් උසුරන්න යනුවෙන් පැවැසීය. (මුස්ලිම්)

بِاسْمِ اللهِ، أَعُوذُ بِعِزَّةِ اللهِ وَقُدْرَتِهِ مِنْ شَرِّ مَا أَجِدُ وَأُحَاذِرُ

අල්ලාහ්ගේ නාමයෙනි. අල්ලාහ්ගේ මහානු භාවය සහ ඔහුගේ ශක්තිය මගින් මා භුක්ති විඳින වේදනාව හා බිය කෙරෙහි රැකවරණය පතමි.

## කරදරයක් ඇතිවන කළ :

74–කරදරයක් ඇතිවන අවස්ථාවේ 'ඉන්නා ලිල්ලාහි වඉන්නා ඉලෛහි රාජිඌන්, අල් -ලාහුම්ම අජුර්නී ෆී මුසීබතී, වඅ්ලුෆ් ලී (ක්)හයිරම් මින්හා' යනුවෙන් ප්‍රාර්ථනා කළ යුතුයි. (මුස්ලිම්)

إنّا للّه وَإنّا إِلَيْه رَاجِعُونَ ، اَللّهُمَّ أجُرْنِيْ فِيْ مُصِيبَتِيْ وَاخْلُفْ لِيْ خَيْراً مِنْهَا

සැබැවින්ම, අපි (සැම දෙනා) අල්ලාහ්ටම හිමිවූ අයවෙ. අප ඔහු වෙතම නැවත යා යුතුවෙ. ස්වාමිනී, කරදරයෙන් මාව නිදහස් කොට එයට වඩා ශ්‍රේෂ්ඨමත් දෙයක් මා හට ලබා දෙනු මැනව.

## අභාවය පිළිබඳව සැනසීම :

75-ඉන්න ලිල්ලාහිමා අහද, වලහු මා අ:තා, වකුල්ලූ ෂයිඉන් ඉන්දහු බිඅජලිම් මුසම්මා, ෆල් තස්බිර් වල් තහ්සිබ්. (බුහාරි, මුස්ලිම්)

إِنَّ لِلَّهِ مَا أَخَذَ، وَلَهُ مَا أَعْطَى، وَكُلُّ شَيْءٍ عِنْدَهُ بِأَجَلٍ مُسَمًّى، فَلْتَصْبِرْ وَلْتَحْتَسِبْ

ප්‍රශංසා සියල්ල අල්ලාහ්ටම හිමිවේ. ඔහු (අපෙන්) රැගත් දේද, ඔහු (අපහට) ලබා දුන් දේද හා (අනෙක්) සැම දේ ඔහු වෙත සීමිත කාල සීමාවකින් පවතී. එහෙයින්, ඔබ ඉවසීමෙන් සිටින්න. එකී කුලිය බලා පොරොත්තු වන්න.

## මිනිය වළෙහි තබන කළ :

76-බිස්මිල්ලාහි, වඅලා සුන්නති රසූලිල්ලාහි.

بِسْمِ اللهِ وَعَلَى سُنَّةِ رَسُولِ اللهِ

අල්ලාහ්ගේ නාමයෙන් හා නබිනායක මුහම්මදු (සල්) තුමාගේ මාර්ගයෙන් භූමි දානය කරන්නෙමු. (අබූදාවූද්)

## මිනීවළ බැහ දකින කළ :

77–අස්සලාමු අලෛයිකුම් අහ්ලද් දියාරි මිනල් මූඃමිනීන වල් මුස්ලිමීන්, වඉන්නා ඉන්ෂා අල්ලාහු බිකුම් ලාහිකූන්, නස්අලුල්ලාහ ලනා වලකුමුල් ආෆියා. (මුස්ලිම්)

اَلسَّلامُ عَلَيْكُمْ أَهْلَ الدِّيارِ مِنَ الْمُؤْمِنِينَ وَالْمُسْلِمِينَ، وَإِنَّا إِنْ شَاءَ اللهُ بِكُمْ لَاحِقُونَ، نَسْأَلُ اللهَ لَنَا وَلَكُمُ الْعَافِيَةَ.

ඔ : මෙම නිවැසියන්වූ මුස්ලිම් වරුනි, විශ්වාස වන්තයිනි, ඔබලා හමුවට සාමය පහළවනු මැනව. අල්ලාහ් කැමැතිවූ කළ අපිද ඔබලා හමුවට පැමිණීමු. අපට හා ඔබට යහපත ලබා දෙන මෙන් අල්ලාහ් ගෙන් අයදින්නෙමු.

## කෝපවන කළ :

78-අඌදු බිල්ලාහි මිනෂ් ෂෙයිතානිර් රජීම

أَعُوْذُ بِاللهِ مِنَ الشَّيْطَانِ الرَّجِيمِ

පලවා හරිනලද ෂෙයිතාන්ගේ උවදුරුවත් කෙරෙහි මා අල්ලාහ්ගෙන් රැකවරණය පතමි.

### අල්කුර්ආනයෙහි සඳහන්

# සමහර ප්‍රාර්ථනාවන්

## දෙමාපියන්ට කරන ප්‍රාර්ථනා :

79-රබ්බිග්ෆිර් ලී වලිවාලිදයිය, රබ්බිර්හම් හුමා කමා රබ්බයානී සගීරා.

رَبِّ اغْفِرْ لِيْ وَلِوَالِدَيَّ ، رَبِّ ارْحَمْهُمَا كَمَا رَبَّيَانِيْ صَغِيرًا.

මාගේ ස්වාමිනී, මාහට හා මාගේ දෙමාපි යන්හට කමා කරනු මැනව. ස්වාමිනී, මා

කුඩා දරුවෙකු ලෙස සිටින කළ (මාගේ දෙමාපියන්) මාව හදා වඩා පෝෂණය කළ සේ, ඔබද ඔවුන් දෙදෙනාහට කරුණාව පහළ කරනු මැනව. (71:28 හා 17:24)

## අඹු සැමියන් තමන්ට හා දරුවන්ට ප්‍රාර්ථනා කිරීම :

80-රබ්බනා හබ්ලනා මින් අස්වාජිනා වදුර්රියාතිනා කුර්රත අඃයුනින් වජ්අල්නා ලිල් මුත්තකීන ඉමාමා, රබ්බිජ්අල්නී මුකීමස් සලාතී වමින් දුර්රියයතී, රබ්බනා වත කබ්බල් දුආඉ, රබ්බනග්ෆිර්ලී වලිවාලිදයිය වලිල් මුඃමිනීන යෙවම යකුමුල් හිසාබ්.

رَبَّنَا هَبْ لَنَا مِنْ أَزْوَاجِنَا وَذُرِّيَّاتِنَا قُرَّةَ أَعْيُنٍ وَاجْعَلْنَا لِلْمُتَّقِينَ إِمَاماً، رَبِّ اجْعَلْنِي مُقِيمَ الصَّلاة وَمِنْ ذُرِّيَّتِي ، رَبَّنَا وَتَقَبَّلْ دُعَاءِ ، رَبَّنَا اغْفِرْ لِي وَلِوَالِدَيَّ وَلِلْمُؤْمِنِينَ يَوْمَ يَقُومُ الْحِسَابُ.

අප ස්වාමිනී, අප බිරිඳන්ගෙන් හා අප දරුවන්ගෙන් අපහට නැත් පිනවීමක් ලබා දෙනු මැනව. තවද, අපව බියබැතිමතුන්ට (යහමග කරා කැඳවන) මග පෙන්වන්නන් බවට පත්කරනු මැනව. මාගේ ස්වාමිනී, මාව හා මාගේ පරම්පරාවෙ අය සලාතය ඉටු කරන්නන් ලෙසට පත් කරනු මැනව. අප ස්වාමිනී, මාගේ ප්‍රාර්ථනාව පිළිගනු මැනව. අප ස්වාමිනී, මාහටද මාගේ දෙමා පියන්ටද හා විශ්වාස වන්තයින්ටද ප්‍රශ්න කිරීම සිදුකරන (පරලොව) දිනයෙහි කමා කරනු මැනව. (25:74, 14:40,41)

## ඥානය වර්ධනය වීම සඳහා :

81-රබ්බි සිද්නී ඉල්මා, රබ්බිෂ්රහ් ලී සද්රී, වයස්සිර් ලී අම්රී, වහ්លුල් උකුදතම් මිල් ලිසානී, යෆ්කහූ කව්ලී.

رَبِّ زِدْنِي عِلْمًا، رَبِّ اشْرَحْ لِيْ صَدْرِيْ ، وَيَسِّرْ لِيْ أَمْرِيْ، وَاحْلُلْ عُقْدَةً مِّنْ لِّسَانِي يَفْقَهُوا قَوْلِيْ.

මාගේ ස්වාමිනී, මාහට ඥානය වර්ධනය කරනු මැනව. මාගේ ස්වාමිනී, මාගේ හදවත (ස්ථිර කොට) විස්තීර්ණ කරනු මැනව. මාගේ කාර්යයන් සරල කරනු මැනව. මාගේ ප්‍රකාශ ඔවුන් වටහා ගැනීම සඳහා මාගේ දිවෙහි පවතින ගැටය ලිහිල් කරනු මැනව. (20:25,114)

## සටහන :

ඉහත සඳහන් ප්‍රාර්ථනාවන්ට අමතරව අල් කුර්ආනයේ පහත සඳහන් අංක දරණ වැකි වලද විශේෂ හා ගැඹුරු අර්ථවත් ප්‍රාර්ථනා වන් සඳහන් වෙ.

(2:201,286), (3:8,147,193), (7:23,89,126,149), (18:10), (21:83,87,89), (23:97,98), (25:65), (26:83,84,85), (37:100), (59:10), (66:8)

82-නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්ලා හුම්ම ආ(න්)තිනා ෆිද්දුන්යා හසනතන්, වෆිල් ආක්රති හසනතන්, වකිනා අදාබන්

නාර්' යනුවෙන් ප්‍රාර්ථනා කරන්නේය. (බුහාරි හා මුස්ලිම්)

اَللّهُمَّ آتِنَا فِي الدُّنْيَا حَسَنَةً ، وَفِي الْآخِرَةِ حَسَنَةً ، وَقِنَا عَذَابَ النَّارِ.

ස්වාමිනී, අපහට මෙලොවෙහිද පරලොවෙහිද භාග්‍යයන් ලබා දෙනු මැනව. තවද, නරකාදියෙහි වේදනාවෙන් අපව ආරක්ෂා කරනු මැනව.

83-නබිනායක මුහම්මදු (සල්) තුමා අබූමූසා (රලි) තුමා අමතා 'ස්වර්ග නිධානවලින් එකක් ගැන ඔබට මා වටහා දෙන්නද ? යැයි විමසීය. එයට ඔහු 'දැනුම් දෙන්න' යැයි කීය. එකල නබිතුමා එය 'ලා හවල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්' යන්නේය' යනුවෙන් පැවැසීය. (බුහාරි)

لاَ حَوْلَ وَلاَ قُوَّةَ إِلاَّ بِاللهِ

අල්ලාහ්ගේ පිහිටෙන් තොරව කුසල් ක්‍රියාවන්හි යෙදීමටද අකුසල් ක්‍රියවලින් මිදීමටද කවරෙකුට හෝ ශක්තියක් නැත.

84-නබිනායක මුහම්මදු (සල්) තුමා 'සුබ්හානල්ලාහි වබි හම්දිහි, සුබ්හාවනල්ලාහිල් අලීම්' යන වැකි දෙක (උසුරීමට) දිවට පහසුවන හා (පරලොවෙහි) තුලාවට සනව පවතින වැකි දෙකක්ය යනුවෙන් ප්‍රකාශ කළේය. (බුහාරි)

سُبْحَانَ اللهِ وَبِحَمْدِهِ سُبْحَانَ اللهِ الْعَظِيمِ

අල්ලාහ්ට ප්‍රශංසා කොට උත්කෘෂ්ඨ කරමි. උත්කෘෂ්ඨවූ අල්ලාහ් පවිත්‍ර වන්තයෙකි.

ස්වාමිනී !
අප සැමට සැම විටම
ඔබව සිහි කිරීමේ භාග්‍යය
ලබා දෙනු මැනව...

مطبعة النرجس التجارية
NARJIS PRINTING PRESS
تلفون : ٢٣١٦٦٥٣ / ٢٣١٦٦٥٤
فاكس : ٢٣١٦٨٦٦ الرياض

# كتاب الأذكار

سنهالي

ردمك ٣-٥٥-٨٦٤-٩٩٦٠

المكتب التعاوني للدعوة والإرشاد وتوعية الجاليات بالسلطانة
تحت إشراف وزارة الشؤون الإسلامية والأوقاف والدعوة والإرشاد
THE COOPERATIVE OFFICE FOR CALL & FOREIGNERS GUIDANCE AT SULTANAH